## මෙහෙවර දැක්ම



**“පරිසර හිතකාමී සහ නව ක්‍රමවේදයන් හරහා**

**පොස්පරස් වලින් ස්වයංපෝෂිත වෙමින්**

**ජාතික පොස්පේට් අවශ්‍යතාවය සැපිරීම”**

# පටුන


- අධ්‍යක්ෂ මණ්ඩලය 01
- සංස්ථාපිත තොරතුරු 02
- මූල්‍ය ඉස්මතු කිරීම් 03
- සභාපතිතුමාගේ ප්‍රකාශණය 04-05
- කළමනාකරණය 06
- අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 07-09
- විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව 10

  විගණකවරුන්ගේ වාර්ථාව 11

  විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 12

  මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 13-14

  ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය 15

  මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 16-17

  වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 18-27

  මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ සටහන් 28-39

- මෙහෙයුම් ක්‍රියාවලි සමාලෝචනය 40-42
- රුස්වීම් වාරය දැනුම්දීම 43
- පෙරකලාසියේ ආකෘති 44

# අධ්‍යක්ෂ මණ්ඩලය



ජාලිය පී. කුලසේකර මහතා
සභාපති/කළමනාකරණ අධ්‍යක්ෂක



ආර්. ආර්. එම්. එන්. රාජපක්ෂ මහතා
විධායක අධ්‍යක්ෂක



බී. එම්. ඩී. එම්. බාලසූරිය මිය
අධ්‍යක්ෂක



අමරපාල ගමගේ මහතා
අධ්‍යක්ෂක



ඩී. එම්. විජේපාල මහතා
අධ්‍යක්ෂක



ඩී. ඩී. අමරතුංග මහතා
අමාත්‍යාංශ නිරීක්ෂක

## සංස්ථාපිත තොරතුරු

### සමාගමේ නම

සි/ස ලංකා පොස්පේට් සමාගම

### පිහිටි ස්ථානය සහ නීතිමය ස්වරූපය

සි/ස ලංකා පොස්පේට් ආයතනය 1992 ජූලි මස 10 වන දින සීමිත වගකීමක් ඇති සමාගමක් වශයෙන් 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත කරන ලද්දේ රාජ්‍ය කැනීම් හා ඛණිජ සංවර්ධන සංස්ථාවේ එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය, 1987 අංක 23 දරණ පොදු සංස්ථා හෝ රජයට අයිතිය ඇති පවරා ගන්නා ව්‍යාපාර පොදු සමාගම් වශයෙන් පරිවර්තනය කිරීමේ පනත යටතෙහිය. කෙසේ නමුත් 2007 අංක 7 දරණ සමාගම් ආඥා පනත යටතේ මෙකී සමාගම නැවත ලියා පදිංචි කරනු ලැබ ඇත.

### මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

නිරන්තර කෘෂි භෝග සඳහා පොහොර වශයෙන් යොදවන පාෂාණ පොස්පේට් කැනීම, සැකසීම සහ අලෙවි කිරීම සමාගමේ ප්‍රධාන කටයුතු වේ.

### ලියාපදිංචි අංකය

පි. බී. 308

### අධ්‍යක්ෂ මණ්ඩලය

ජාලිය පී. කුලසේකර මහතා
(සභාපති/කළමනාකරණ අධ්‍යක්ෂක)
ආර්. ආර්. එම්. එන්. රාජපක්ෂ මහතා
(විධායක අධ්‍යක්ෂක)
බී. එම්. ඩී. එම්. බාලසූරිය මිය (අධ්‍යක්ෂක)
අමරපාල ගමගේ මහතා (අධ්‍යක්ෂක)
ඩී. එම්. විජේපාල මහතා (අධ්‍යක්ෂක)
ඩී. ඩී. අමරතුංග මහතා (අමාත්‍යාංශ නිරීක්ෂක)

### සමාගමේ ලේකම්

සි/ස මූල්‍ය සේවා සහ වෙළඳ නියෝජිත පුද්ගලික සමාගම, නිතිඥවරු, අංක 28, රොස්මිඩ් පෙදෙස, කොළඹ 7

### මව් සමාගම

ශ්‍රී ලංකාවේ රජය වෙනුවෙන් භාණ්ඩාර ලේකම්ට මෙම සමාගමේ නිකුත් කළ කොටස් සම්පූර්ණයෙන්ම අයිතිව ඇත.

### රේඛීය අමාත්‍යංශය

රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යංශය
අංක 561/3, ඇල්විටිගල මාවත,කොළඹ 5

### ලියාපදිංචි කාර්යාලය

අංක 73-1/1, නව කැළණි පාලම පාර
කොළඹ 14
දුරකථන අංකය – 94112459906/7
ෆැක්ස් අංකය - 94112459908

### විගණකවරු

එස්. ජේ. එම්. එස්. ඇසෝෂියෙට්
වරලත් ගණකාධිකාරිවරු,
නො. 02, කාසල් පටුමග,
කොළඹ 04.

### බදු උපදේශකවරු

අමරසේකර සහ සමාගම
වරලත් ගණකාධිකාරින්
12 – රොටුන්ඩා උද්‍යානය
කොළඹ 3

### බැංකු කරුවන්

ලංකා බැංකුව
මහජන බැංකුව
හැටන් නැෂනල් බැංකුව

# මූල්‍ය ඉස්මතු කිරීම්

**වාර්ෂික ප්‍රතිඵල සාරාංශය** (රුපියල් '000)

| | 2012/13 | 2011/12 | 2010/11 |
|---|---|---|---|
| ආදායම | 399,031 | 491,280 | 393,068 |
| ශුද්ධ ලාභය | 79,536 | 129,805 | 86,478 |
| මූළ විස්තිරණ ආදායම | 98,150 | 144,001 | 82,968 |

**වර්ෂ අවසානයේ සාරාංශය** (රුපියල් '000)

| | 2012/13 | 2011/12 | 2010/11 |
|---|---|---|---|
| කොටස්කරුවන්ගේ අරමුදල | 587,901 | 529,751 | 405,750 |
| කාරක ප්‍රාග්ධනය | 511,821 | 462,171 | 395,228 |
| මූළ වත්කම් | 640,020 | 612,678 | 492,672 |
| කාර්ය මණ්ඩල වැය | 156,989 | 161,143 | 145,638 |
| සේවක සංඛ්‍යාව | 285 | 294 | 307 |

**කොටසකට** (රුපියල්)

| | 2012/13 | 2011/12 | 2010/11 |
|---|---|---|---|
| ඉපයීම් | 10.97 | 17.90 | 11.93 |
| ශුද්ධ වත්කම් | 81.08 | 73.06 | 55.96 |

| **අනුපාතයන්** | 2012/13 | 2011/12 | 2010/11 |
|---|---|---|---|
| ජංගම අනුපාතය ( වාර ) | 21.41 | 12.67 | 12.28 |
| කොටස්කරුවන්ගේ අරමුදලට ප්‍රතිලාභ(%) | 16.69 | 27.18 | 20.45 |

# සභාපතිගේ ප්‍රකාශනය



රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර පොදු සමාගම් වලට පරිවර්තනය කිරීමේ 1987 අංක 23 දරණ පනතේ කොන්දේසි යටතේ පොස්පේට් සමාගම 1992 ජුලි මස 10 වන දින සංස්ථාපිත කරන ලද්දේ රාජ්‍ය කැනීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවේ එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය පවරා ගැනීමටය. මෙම සමාගමෙහි අයිතිය ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාර ලේකම්තුමා සතුවෙයි. 1998 නොවැම්බර් මස බෝගල ග්‍රැපයිට් ආයතනයේ වෙන්වීමත් සමඟ ලංකා පොස්පේට් සමාගම සම්පූර්ණයෙන්ම නිදහස් ආයතනයක් බවට පත්විය. මෙම විශාල පොස්පේට් නිධිය පිහිටි අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් එප්පාවල භූමියෙහි හෙක්ටයාර් 450ට වඩා භූමිභාගයක කැනීම් අයිතිය සමාගම සතුව පවතියි. ලෝකයේ පොහොසත්ම සහ අසමසම එක්තරා පොස්පේට් නිධියක් ලෙසට සලකන **33 % - 40%** ක පමණ $P_2O_5$ අඩංගු මෙම ඛනිජ පස මෙට්‍රික් ටොන් මිලියන **60** ක් පමණ ඇති බවට තක්සේරු කොට ඇත.

වර්තමානයේ සමාගම විසින් එප්පාවල රොක් පොස්පෙට් (ERP) සහ අධි – ශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට් (HERP) යනුවෙන් වර්ග දෙකක් නිපදවනු ලබන අතර මේවා වාර්ෂික භෝග සඳහා භාවිතා කරනු ලැබේ. කෙසේ වෙතත් මෙම නිධිය තුලින් ජාතිය සඳහා උපරිම ප්‍රතිලාභයක් ලබාදීම වෙනුවෙන් කටයුතු පුළුල් කිරීමට ආයතනය බලාපොරොත්තුවෙන් සිටියි.

වර්තමානයේ අප වාර්ෂිකව එප්පාවල රොක් පොස්පේට් මෙ. ටො. **55,000** ක් පමණ නිපදවන අතර එම අගය රටේ වැවිලි භෝග අංශය සඳහා විකුණනු ලබයි. අපගේ පොහොර තේ, රබර්, පොල්, පළතුරු සහ අපනයන මුදල් භෝග සඳහා භාවිතාකරනු ලබයි. තේ වගාව සඳහා පොස්පේට් වලින් **60%** ක ප්‍රමාණයක්ද රබර් සහ පොල් සඳහා **30%** ක ප්‍රමාණයක්ද මෙයින් භාවිතා කරනු ලැබේ. ඉතිරි 10% අපනයන මුදල් භෝග සහ පළතුරු සඳහා භාවිතා කරනු ලබයි. අපගේම පොහොර වර්ගයක් භාවිතා කිරීම තුලින් රටට රුපියල් මිලියන **500** ක පමණ වාර්ෂික විදේශ විනිමයක් ඉතිරි කිරීමට හැකියාව ලැබේ.

රුපියල් මිලියන **399**ක දළ පිරිවැටුමක් මුදුන්පත් කර ගනිමින් **2012/2013** මූල්‍ය වර්ෂය අවසන් විය. ලංකා පොස්පේට් ආයතනය මෙට්‍රික් ටොන් **39,216.25** ක එප්පාවල රොක් පොස්පේට් විකුණුම් මට්ටමක්ද, හයිග්‍රේඩ් එප්පාවල රොක් පොස්පේට් මෙ.ටො **6,543.85** ක විකුණුම් මට්ටමක්ද මුදුන් පත්කරගෙන ඇති බව සතුටින් යුතුව දැනුම් දෙමි. ඒ වාගේම සතුටින් යුතුව ප්‍රකාශකරනුයේ පිරිවැය වැඩිවීමෙ තත්ත්වයක් යටතේ වුවද රුපියල් මිලියන **136.9** ක බදු පෙර ලාභයක් උපයාගෙන ඇති බවයි. තව දුරටත් සමාගමේ ඵලදායිතාවය උසස් මට්ටමකට ගෙන වැඩිදියුණු කිරීමට ඉදිරි වර්ෂයේදී විධිමත් සැලසුම් සහ සංවිධානගත නිසි ක්‍රමවේදයක් අවශ්‍යව ඇත.

වර්ෂය තුළදී පැයකට මෙ. ටො. 10ක ERP – HERP ධාරිතාවයකින් යුත් නව ඇඹරුම් යන්ත්‍රයක් මිළදී ගෙන සවිකිරීමට අපට හැකි විය. ඒ සමඟම අතිගරු ජනාධිපතිතුමාගේ පොහොර සහනාධාර සංකල්පය යටතේ වර්ධනය වී ඇති වෙළඳපොළ ඉල්ලුම සපුරාගත හැකි නිෂ්පාදන මට්ටමක් ලඟාකර ගැනීමට අපට හැකිවී ඇත. එසේම වාර්ෂික භෝග භාවිතය පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා, පොල් පර්යේෂණ ආයතනය සහ ලක් පොහොර සමාගම සමඟ ඒකාබද්ධව වැඩමුළු අප විසින් පවත්වන ලදී.

ඉදිරියේදී අප හට විශාල අභියෝගයක් පවතී. එප්පාවල පොස්පේට් සංචිත භාවිතය සම්බන්ධයෙන් පවත්නා ව්‍යාපාරික කටයුතු වැඩිදියුණු කිරීම සඳහාත් නව ව්‍යාපාරික අවස්ථා කෙරෙහි යොමුවීම සඳහාත් සුදුසු ක්‍රමවේදයන් හා විසඳුම් කෙරෙහි සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය සැලකිලිමත්ව සිටිති.

අප රටේ කෙටිකාලීන භෝග සඳහා පොහොර අවශ්‍යතාව ඉටුකිරීමට හැකිවන පරිදි වැඩියෙන් දියවන සුළු පොස්පේට් පොහොර වර්ගයක් වශයෙන් ත්‍රිපල් සුපර් පොස්පේට් ( TSP– හෝ සිංගල් සුපර් පොස්පේට් (SSP) හඳුනාගෙන ඇත. සමාගමේ අළුත් ව්‍යාපෘතියක් වන TSP / SSP පොහොර නිෂ්පාදනය සඳහා ප්‍රාදේශිය කර්මාන්ත ශාලාවක් පිහිටුවීමෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයට වඩාත් වාසිදායක තත්ත්වයක් උදාවෙන අතර TSP ආනයනය සඳහා

වාර්ෂිකව පිටතට ගලායන විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරිකරගත හැකිවේ.

මව්බිමෙහි සාරවත් බව නංවාලීම උදෙසා උපකාරීවෙමින්, කෘෂිකාර්මික ඵලදායිතාවය වැඩිදියුණු කරමින්, ජාතික ආර්ථිකය කෙරෙහි සුවිශේෂි කාර්යයභාරයක් ඉටුකිරීමට වගකිවයුතු රාජ්‍ය ආයතනයක් වශයෙන් අපට හැකියාව පවතී. රටේ ජනතාවට අවශ්‍ය සේවාවන් නිසි පරිදි සපයමින් අප ආයතනයේ නිශ්චිත ඉලක්ක ඉටුකර ගැනීමට අපේක්ෂා කරන බවද මම සඳහන් කරමි.

මානව සම්පත් සංවර්ධනය, තොරතුරු තාක්ෂණය සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ආයතනයක වැඩි ඵලදායිතාවය, තරගකාරීත්වය, ලාභදායී බව සහ තිරසාරබව සඳහා අවශ්‍යයැයි මම අදහස් කරමි. කාර්යය මණ්ඩල පුහුණුවීම් වැඩසටහන්වලට ප්‍රමුඛත්වය දෙමින් සේවකයන්ගේ කුසලතාවයන් හා හැකියාවන් සෑම අංශයකින්ම වැඩි දියුණු කිරීමටද කටයුතු යොදා තිබේ.

අවසාන වශයෙන්, මා විසින් මේ සම්බන්ධයෙන් අප වෙත මහ පෙන්වීම්, ධෛර්‍යය සහ සහයෝගය ලබාදෙන රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාශයටත්, මහා භාණ්ඩාගාරයටත් සහ සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයටත් මාගේ ප්‍රණාමය පුදකරමි.



සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී
ලංකා පොස්පේට් සමාගම

# ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන්



කපිතාන් (විශ්‍රාමික) ඉංජිනේරු උපුල් කුමාරසේන
සාමාන්‍යාධිකාරී



එච්. ආර්. යූ. ඩී. බණ්ඩාර
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී



යූ. එස්. පී. ජී. සූරියආරච්චි
තඩත්තු කළමනාකාර



ඩී. ජී. යූ. චාමර
මූල්‍ය කළමනාකාර



ජී. ඒ. චන්ද්‍රදාස
නිෂ්පාදන කළමනාකාර



ඩී. ඒ. එම්. මුණසිංහ
කළමනාකරු (පිරිස්/පරිපාලන)

# කළමණාකරුවන්



කපිතාන් කේ.ජී.ආර්.පී.කිරිඇල්ල
ආරක්ෂක නිලධාරී



එම්. එම්. ඩී. තිලකරත්න
අභ්‍යන්තර විගණක



එල්. ආර් බස්නායක
නිෂ්පාදන ඉංජිනේරු



එස්. ඒ. අබේසිරි
සැපයුම් නිලධාරී



ඩබ්ලිව්. ආර්. ඉලංගසිංහ
ප්‍රවාහන නිලධාර



ඩී. ආර්. කේ. තිලකරත්න
මූල්‍ය නිලධාරී



එස්.එම්.ඒ.ආර්.කේ. මංචනායක
පිරිස් හා පරිපාලන නිලධාරී



ආර්. ඒ. ඒ. පී. රණසිංහ
අලෙවි නිලධාරී

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

සී/ස ලංකා පොස්පේට් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඔවුන්ගේ විගණන ගිණුම් ලේඛණ සහ වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරයි.

**1. 0** **සමාගමේ නම**

ලංකා පොස්පේට් සමාගම (ලි.ප.අ. PB308)

**2. 0** **පිහිටි ස්ථානය හා නීතිමය ස්වරූපය**

රාජ්‍ය පතල් හා ඛණිජ සංවර්ධන සංස්ථාවෙහි එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය පවරා ගැනීම සඳහා 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර පොදු සමාගම් බවට පත්කිරීමේ පනතට අනුව සීමාසහිත ලංකා පොස්පේට් සමාගම සීමාසහිත වගකීම් සහිත සමාගමක් වශයෙන් 1992 ජූලි 10 වන දින සංස්ථාගත කරන ලදී. කෙසේ නමුත් මෙම ආයතනය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරනු ලැබිය.

**3. 0** **ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය**

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ බහු වාර්ගික භෝග සඳහා පොහොර වශයෙන් යොදා ගන්නා පොස්පේට් කැනීම් සිදුකිරීම, සකස් කිරීම, හා අලෙවි කිරීමයි.

**4.0** **මූල්‍ය ප්‍රකාශනය**

මේ සමඟ අමුණා ඇති මූල්‍ය ප්‍රකාශනයෙන් ශේෂ පත්‍ර දිනට සමාගමේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පෙන්නුම් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය තෘප්තිමත්ව සිටී.

මෙම මූල්‍ය ප්‍රකාශනය සැකසීමේදී සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගී කර ගනිමින් ඒවාට අනුරූපව සාධාරණව සහ ඒකාකාරිව නිගමන හා තක්සේරුකරණයන් සිදු කොට ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි. ගිණුම්කරණ පිළිවෙත්වල සැලකිය යුතු වෙනසක් සිදුවී නොමැත. සමාගමේ වත්කම්වල සුරක්ෂිතභාවය රැක ගැනීමටත්, වංචාකාරී හෝ අවිධිමත් කටයුතු වලින් සුරැකීම සඳහාත් පියවර ගෙන ඇත.

**5.0** **මූල්‍ය ප්‍රකාශන සහ ගිණුම්කරණ පිළිවෙත්**

මෙම මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ගණුදෙනු නිසි ලෙසට පෙන්නුම් කිරීමට සාධාරණව ඥාණාන්විතව සහ තක්සේරු තිරණවලට එළැඹීම සඳහා සුදුසු අනුරූපිය ගිණුම්කරණ පිළිවෙත් භාවිතයට ගෙන ඇත. ගිණුම්කරණ කාල පරිච්ජේදය තුළ ගිණුම්කරණ පිළිවෙත්වල කිසිදු වෙනසක් සිදු නොවිය.

**6.0** **දේපළ, යන්ත්‍රසූත්‍ර, උපකරණ හා ඒවායේ තක්සේරුව සහ ක්ෂයවීම්**

මෙම වර්ෂය තුළ දේපළ, යන්ත්‍රෝපකරණ හා උපකරණවල ප්‍රාග්ධන වියදම රුපියල් 16,236,637/-කි.

එකී දේපළ හා යන්ත්‍රෝපකරණ වල තත්ත්වය හා වෙනස්වීම් පිළිබඳ විස්තර ඒවායේ තක්සේරු අගය, ක්ෂයවීම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 11.0 යටතේ දක්වා ඇත.

**7.0** **බදුකරණය**

බදු අයකළ හැකි ආදායමෙන් මෙම සමාගම නිරීක්ෂණය කරන වර්ෂය තුළ 28% ක බද්දකට යටත් වෙයි.

**8.0** **ලාභාංශ**

නිරීක්ෂණය කරන වසර ඇතුළත රු.මි. 25 ක අතුරු ලාභාංශ ප්‍රකාශ කොට ඇත.

**9.0** **ප්‍රකාශිත ප්‍රාග්ධනය**

සමාගමේ ප්‍රකාශිත මුළු ප්‍රාග්ධනය රුපියල් 72,510,000/- සාමාන්‍ය කොටස් 7,251,000න් සමන්විත වේ. නිරීක්ෂණයට භාජනය කරන වසර ඇතුලතදී ප්‍රකාශිත ප්‍රාග්ධනයේ වෙනසක් නොවිය.

**10.0 කොටස් හිමිකාරත්වය**

පොදු සංස්ථා හෝ රජයට අයිතිව ඇති පවරා ගන්නා ලද ව්‍යාපාර පොදු සමාගම් වශයෙන් පරිවර්තනය කිරීමේ 1987 අංක 23 දරණ පනතේ 2(3) වගන්තිය යටතේ සමාගමේ එකම කොටස්කරු වනුයේ රජය වෙනුවෙන් (රාජකාරි මට්ටමින්) භාණ්ඩාගාර ලේකම්ය.

2013 මාර්තු 31 දිනට සමාගමේ කොටස් හිමිකාරත්වය පිළිබඳ විස්තර පහත සඳහන් වන පරිදි වේ.

භාණ්ඩාගාර ලේකම්ට (රාජකාරි මට්ටමින්) සාමාන්‍ය කොටස් 7,251,000කි.

සී/ස GSMB ටෙක්නිකල් සර්විස් පුද්ගලික සමාගමේ කොටස්කරුවෙක් වන සී/ස ලංකා පොස්පේට් සමාගම රුපියල් 10 බැගින් වන සාමාන්‍ය කොටස් 100,000 ක හිමිකාරත්වය දරයි.

මෙම හිමිකාරත්වය දැරීමේ අගය 16.66% කි.

**11.0 කොටස් හිමිකරුවන්ගේ වෙනස්වීම්**

සමාගමේ කොටස් හිමිකරුවන්ගේ වෙනසක් 31-03-2012 දින වන විට සිදුව නැත.

**12.0 පරිත්‍යාග**

නිරීක්ෂණය කරන වසර තුළදී පුණ්‍ය කටයුතු සහ සාමාජීයීය වගකීම් සඳහා මෙම සමාගම රුපියල් 3,484,125.00ක් වැයකර ඇත.

**13.0 සේවකයින්**

වර්ෂය ඇතුලත සේවක මණ්ඩලයේ සම්පූර්ණ වියදම රුපියල් 156,989,254/- කි.
වර්ෂ අවසානය වන විට සමාගමේ සේවක සංඛ්‍යාව 285 ක් වේ.

**14.0 අධ්‍යක්ෂ මණ්ඩලය**

නිරීක්ෂණය කරන වසර ඇතුලත පහත සඳහන් අය අධ්‍යක්ෂ තනතුරු දැරිය.
අද්මිරාල් දයා සඳගිරි – හිටපු සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි
ආර්. ආර්. එම්. එන්. රාජපක්ෂ මහතා - විධායක අධ්‍යක්ෂක
බී. එම්. ඩී. එන්. බාලසූරිය මිය - අධ්‍යක්ෂක
ජේ. ගමගේ මහතා- අධ්‍යක්ෂක
පි. ඩී. ජේ. ජයවර්ධන - අධ්‍යක්ෂක
සී. එම්. විජේපාල මහතා - අධ්‍යක්ෂක

**15.0 අධ්‍යක්ෂකවරුන් පත්කිරීම හා ඉල්ලා අස්වීම**

සලකා බලන වර්ෂය තුළ අධ්‍යක්ෂක මණ්ඩලයට කිසිවෙකු පත්නොවූ අතර කිසිවෙකුත් ඉල්ලා අස්වූයේද නැත.

**16.0 අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය**

නිරීක්ෂණය කරන වර්ෂය ඇතුලත රුපියල් 3,227,665.24 ක් අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමික හා වියදම් වශයෙන් ගෙවා ඇත.

**17.0 ව්‍යවස්ථානුකූල ගෙවීම්**

අධ්‍යක්ෂ මණ්ඩලයේ උපරිම දැනීමේ සහ විශ්වාසය අනුව රජයට, සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු ව්‍යවස්ථානුකූල ගෙවීම් නිවැරදිව සහ නියමිත වේලාවට ගෙවා ඇති බව දන්වා සිටී.

**18.0 අනුමැතිය**

මෙම සමාගම ශ්‍රී ලංකාවේ හෝ අන්තැනකට අදාල නීති සහ රෙගුලාසි උල්ලංඝනය කිරීමේ ක්‍රියාවල නියැලී නැත.

**19.0 අඛණ්ඩතාවය**

සමාගමේ ක්‍රියාකාරීත්වය අනාගත පෙර දැක්ම කරා පවත්වා ගෙන යැමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය තෘප්තිමත්ව සිටී. ඒ අනුව සමාගමේ සැම මූල්‍ය ප්‍රකාශනයක්ම අඛණ්ඩත්වයේ පදනම මත සූදානම් කර ඇත.

**20.0 සංස්ථාමය පාලනය**

මෙම අධ්‍යක්‍ෂ මණ්ඩලය හොඳ සංස්ථාමය පාලනයක් සහතික කර ඇත. පොදු ව්‍යාපාරයක් වශයෙන් කොටස් හිමිකරුවන්ගේ අපේක්‍ෂා සහ අරමුණු වගේම සමාගමේ අරමුණු වලට සමාන්තරව එහි ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යෑම අධ්‍යක්‍ෂ මණ්ඩලයේ වගකීමයි.

**21.0 අවදානම් කළමනාකරණය**

සමාගමේ ව්‍යවස්ථාමය හා නීතිමය අවශ්‍යතාවන් පිළිබඳවත් නීතිමය අවදානම අවම කර ගැනීම පිළිබඳවත් යහපත් මට්ටමක් පවතී.

**22.0 විගණකයින්**

සමාගමේ වත්මන් විගණකයින් වනුයේ වරලත් ගණකාධිකාරීන් වන එස්. ජේ. එම්. එස්. හවුල්කරුවන්ය.

වර්තමාන විගණකයන් වන එස්. ජේ. එම්. එස්. ඇසෝසියේට්ස් හවුල්කරුවන් ඔවුන්ගේ නෙවක වසරේ සේවය සම්පූර්ණ කොට ඇති අතර ඒ අනුව 2013 සැප්තැම්බර් 30 වන දින පවතින වාර්ෂික මහා සභා රැස්වීමේදී විශ්‍රාමයාමට නියමිතය.

ඒ අනුව ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කොටස් හිමියන්ට නිර්දේශ කර සිටිනුයේ 2007 අංක 07 දරණ සමාගම් පනතේ කරුණු වලට යටත්ව විශ්‍රාමයන විගණකවරු වන එස්. ජේ. එම්. එස්. හවුල්කරුවන් නැවතත් ආයතනයේ විගණකයින් ලෙස 2013 සැප්තැම්බර් 30වන දින ප.ව. 4.30 ට ලංකා පොස්පේට් ප්‍රධාන කාර්යාලයේ නො. 73 1/1 නව කැළණිපාලම පාර, කොළඹ 14 පවත්වනු ලබන වාර්ෂික මහ සභා රැස්වීමේදී පත්කරන ලෙසයි.

විගණකයින්ගේ පාරිශ්‍රමිකය අධ්‍යක්ෂක මණ්ඩලය විසින් නියම කිරීමට අනුමැතිය ලබාදීමට අදාල යෝජනාවක්ද වාර්ෂික මහා සභා රැස්වීමේදී සලකා බැලීමට කටයුතු කොට ඇත.

එස්. ජේ. එම්. එස්. විගණකවරුන්ට ගෙවිය යුතු මුළු පාරිශ්‍රමිකය සලකා බලන වර්ෂය සඳහා රු. 408,408.00කි. බදු උපදේශකවරුන් වශයෙන් අමරසේකර සහ සමාගමට සලකා බලන වසර තුලදී ගෙවීම් රු. 171,432.00 කි

අධ්‍යක්ෂක මණ්ඩලයේ අදහස පරිදි මෙම සමාගම හෝ එහි අනු සමාගම් සමග හෝ විගණකයින්ගේ ස්වාධීනත්වයට බලපෑමක් වන ආකාරයේ සම්බන්ධතාවයක් නොවිය.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්

සභාපති

විධායක අධ්‍යක්ෂක

FINANCIAL SERVICES & COMMERCIAL AGENCIES (PRIVATE) LIMITED

සමාගම් ලේකම්වරු

# විගණක සහ කළමනාකරණ කමිටුවේ වාර්තාව

**සංයුතිය**

අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙම විගණන සහ කළමනාකරණ කමිටුව පත් කරන ලද අතර ඔවුන් අධ්‍යක්‍ෂ මණ්ඩලයට වගකිව යුතුය. ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම් වෙනුවෙන් පත් කර ඇති අධ්‍යක්‍ෂක තැන මෙම කමිටුවේ සභාපති ධූරය දරන අතර සමාගමේ කළමනාකරණ මණ්ඩලය නියෝජනය කරන කමිටු සාමාජිකයින් වශයෙන් සාමාන්‍යාධිකාරි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, මූල්‍ය කළමනාකරු, මානව සම්පත් කළමනාකරු සහ අභ්‍යන්තර විගණක කටයුතු කරති.

## රුස්වීම්

පවත්නා පාලන ක්‍රම විනිශ්චය කිරීමට සහ ප්‍රතිඵල සාකච්ජාකොට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවශ්‍ය නිර්දේශයන් ඉදිරිපත් කිරීම සඳහා විගණක සහ කළමනාකරණ කමිටුව මෙම වර්ෂය තුළ තුන්වතාවක් රුස්වී ඇත.

## ක්‍රියාකාරකම් සහ වගකීම්

**<u>මූල්‍ය වාර්තාකරණය</u>**

සමාගමේ ත්‍රෛමාසික හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සූදානම් කිරීමට තෝරාගෙන ඇති මූල්‍ය වාර්තාකරන පද්ධතියේ විශ්වාසනියත්වය මත 2007 අංක 7 දරණ සමාගම් පනතේ විධි විධාන යටතේ ශ්‍රී ලංකා ගණකාධිකාරණ ප්‍රමිතින්ට අනුකූලව ඇති බවට සහතික කිරීමට කළමනාකරණ මණ්ඩලය සහ බාහිර විගණකයින් සමඟ ඉහත කී කමිටුව කරුණු සාකච්ජාවට හා සමාලෝචනයට බඳුන් කොට ඇත.

**<u>අභ්‍යන්තර විගණනය</u>**


සමාගමේ ශක්තිමත්භාවය, සමස්ථ පාලනය හා ක්‍රියාකාරීත්වය ඉලක්ක කරගෙන අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කරන ලදී.

## නීති සහ රෙගුලාසිවලට යටත්වීම

අදාල නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද මාසික හා ත්‍රෛමාසික වාර්තා නීත්‍යානුකුල අවශ්‍යතාවයන්ට අනුකූල වූ බවට සහතික කිරීම සඳහා ඒවා පරීක්‍ෂා කර බැලීම කමිටුව විසින් සිදු කරයි.

**නිගමනය**

සමාගමේ ගිණුම්කරණ පිළිවෙත්, මෙහෙයුම් පාලනය සහ උපද්‍රව කළමනාකාරිත්ව ක්‍රියාවලිය සමාගමේ ප්‍රතිපත්තිවලට අනුකූලව ඇති බවටත් සමාගමේ වත්කම් නිසි පරිදි ගණනය කොට හරියාකාරව ආරක්‍ෂා කිරීමට සාධාරණ සහතිකයක් සලසන බවටත් විගණන සහ කළමනාකරණ කමිටුව තෘප්තිමත්ව දන්වා සිටී.



සභාපති
විගණන සහ කළමනාකරණ කමිටුව

# ස්වාධීන විගණකයින්ගේ වාර්තාව

**සී/ස ලංකා පොස්පේට් සමාගමේ සාමාජිකයින් වෙත.,**

**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වාර්තාව**

මේ සමඟ ඇති **සී/ස ලංකා පොස්පේට් සමාගමේ** මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලද අතර, 2013 මාර්තු මස 31 වන දින ශේෂ පත්‍රය සහ ආදායම් ප්‍රකාශනය එම වර්ෂ අවසාන හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් සහ විස්තරාත්මක සටහන් වලින්ද සමන්විතවේ.

**මූල්‍ය ප්‍රකාශන වලට කළමණාකාරිත්වයේ වගකීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කොට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කළමනාකාරිත්වය වගකීම දරනු ලැබේ. එසේම ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් වලින් නිදහස්ව මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීමට හා ඉදිරිපත් කිරීමට අදාල අභ්‍යන්තර පාලනයන් නිර්මාණය, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යෑම, නිසි ගිණුම්කරණ ප්‍රමිතීන් තෝරා ගෙන ඒවා ක්‍රියාවට නැංවීමත්, වාතාවරණයට සුදුසු වගකිව යුතු ගිණුම් තක්සේරු සිදු කිරීම කෙරෙහිද කළමණාකාරිත්වය වගකීම දරයි.

**විගණක විෂය පථය සහ නිගමනයේ පදනම**

අප වගකීම වනුයේ අපගේ විගණන කටයුතු පාදක කරගෙන මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කිරීමයි. අපගේ විගණන කිරීම් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව පවත්වන ලදී. මෙම ප්‍රමිතීන්වල අවශ්‍යතාවය වනුයේ විගණන සැලසුම් කර, ඉටුකර මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක වැරදි දැක්වීම්වලින් තොර බවට සාධාරණ සහතිකයක් ලබා ගැනීමය.

මූල්‍ය ප්‍රකාශනයේ දත්ත සහ අනාවරණය කිරීම් සාධක සමඟ පරීක්ෂණ පදනම මත අත්හදා බැලීම අපගේ විගණන ක්‍රියාවලියට ඇතුලත් වේ. සමස්ථ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා කළමනාකාරිත්වය සකස් කරන ලද වැදගත් ඇස්තමේන්තු සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති, තක්සේරු කිරීම සහ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම, ඇගයීම විගණනයට ඇතුලත් වේ.

අපගේ විගණන කිරීම් සඳහා අපගේ ප්‍රශස්ත දැනුම සහ විශ්වාසය පරිදි අවශ්‍ය වූ තොරතුරු සහ විස්තරාවරණයන් අප ලබා ගෙන තිබේ. එම නිසා අපේ නිගමනයන්ට අනුව විගණන කිරීම් තුලින් සාධාරණ මතයක් ප්‍රකාශ වන බව අපගේ විශ්වාසයයි.

**නිගමනය**

අපගේ නිරීක්ෂණ තුලින් අනාවරණය වන පරිදි 2013 මාර්තු මස 31 වන දිනෙන් අවසන්වන වර්ෂය සඳහා මෙම සමාගම නිසි ගිණුම් වාර්තා පවත්වා ගෙන ඇති බව අපගේ මතයයි. 2013 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය තුලදී සමාගමේ ක්‍රියාකාරී කටයුතු පිළිබඳව සත්‍ය හා සාධාරණ දර්ශණයක් මූල්‍ය ප්‍රකාශන තුලින් පෙන්නුම් කරන අතර එකී කටයුතු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සිදු කොට ඇත.

**අනෙකුත් නීත්‍යානුකූල සහ පාලන අවශ්‍යතා ගැන වාර්තාවක්**

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරණ සමාගම් පනතේ 151 (2) වගන්තියට අනුකූල බව ප්‍රකාශ කරමි.

SJMS Associates

SJMS ASSOCIATES
Chartered Accountants
Colombo

**එස්. ජේ. එම්. එස්. ඇසෝෂියෙට්**
**වරලත් ගණකාධිකාරින්,**
**කොළඹ**
**2013 අගෝස්තු 30**

# ආදායම් ප්‍රකාශනය

**සී/ස ලංකා පොස්පේට් සමාගම**

**2013 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය**

| | | 2012/2013 | 2011/2012 |
|---|---|---|---|
| | සටහන | රුපියල් | රුපියල් |
| ආදායම | 5 | 399,031,481 | 491,279,533 |
| විකුණුම් පිරිවැය | | (176,323,948) | (192,287,311) |
| දළ ලාභය | | 222,705,533 | 298,992,221 |
| වෙනත් ආදායම් | 6 | 53,423,346 | 38,125,203 |
| බෙදාහැරීමේ වියදම් | | (6,485,603) | (7,114,844) |
| පරිපාලන වියදම් | | (151,397,292) | (141,533,109) |
| මූල්‍ය වියදම් | 7 | - | (8,932.68) |
| **බදු වලට පෙර ලාභය** | 8 | 118,247,984 | 188,460,539 |
| ආදායම් බදු | 9 | (38,712,211) | (58,655,362) |
| වර්ෂයේ ශුද්ධ ලාභය | | 79,535,773 | 129,805,177 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | |
| නිශ්චිත ප්‍රතිලාභ මත ආයුගණන ආදායම | | 18,614,321 | 14,195,733 |
| වර්ෂයේ මුළු වෙනත් විස්තීර්ණ ආදායම් | | 18,614,321 | 14,195,733 |
| වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම් | | 98,150,094 | 144,000,910 |
| **කොටසක ඉපැයුම (රුපියල්)** | 10 | 11 | 18 |

පිටු අංක 18 - 26 දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලට අන්තර්ගත වන බව සැලකිය යුතුයි.

**සී/ස ලංකා පොස්පේට් සමාගම**
**2013 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය**

| | සටහන | 31.03.2013 රුපියල් | 31.03.2012 රුපියල් | 01.04.2011 රුපියල් |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපළ, යන්ත්‍රසූත්‍ර හා උපකරණ | **11** | 99,731,584 | 100,064,625 | 46,043,415 |
| කොටස්වල ආයෝජනය | **12** | 1,000,000 | 1,000,000 | 1,000,000 |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය | | - | 956,168 | 887,208 |
| දිගුකාලීන ණය | **13** | - | 1,522,038 | 3,931,258 |
| විලම්භිත බදු | **14** | 2,388,357 | 7,353,957 | 10,542,400 |
| | | **103,119,941** | **110,896,788** | **62,404,281** |
| **ජංගම වත්කම්** | | | | |
| තොග | **15** | 87,218,892 | 69,042,402 | 40,653,986 |
| වෙළඳ ණය ගැතියෝ | | 39,256,431 | 33,175,325 | 31,198,225 |
| තැන්පතු, ඉදිරියට ගෙවීම් සහ වෙනත් ලැබිය යුතු දෑ | **16** | 50,202,603 | 54,465,699 | 55,322,909 |
| වසරක් තුළ ලැබිය යුතු දිගුකාලීන ණය | **13** | 1,303,018 | 2,628,240 | 2,628,240 |
| කෙටිකාලීන තැන්පතු | | 320,577,775 | 296,803,354 | 250,120,043 |
| මුදල් සහ මුදල් සමාන දෑ | **17** | 38,341,754 | 45,666,638 | 50,344,325 |
| | | **536,900,473** | **501,781,659** | **430,267,728** |
| **මුළු වත්කම්** | | **640,020,413** | **612,678,447** | **492,672,009** |
| **හිමිකම් සහ වගකීම්** | | | | |
| **ප්‍රාග්ධනය සහ සංචිත** | | | | |
| ප්‍රාග්ධනය | **18** | 72,510,000 | 72,510,000 | 72,510,000 |
| රඳවා ගත් ඉපැයුම් | | 515,391,055 | 457,240,961 | 333,240,052 |
| මුළු හිමිකම් | | **587,901,055** | **529,750,961** | **405,750,052** |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| විශ්‍රාම දිමනා බැදීම් | **19** | 27,039,602 | 43,316,874 | 51,882,087 |

**ජංගම වගකීම්**

| | | | | |
|---|---|---|---|---|
| වෙළඳ ණය හිමියෝ | | 9,349,444 | 2,702,576 | 3,928,609 |
| ආදායම් බදු | | 7,241,137 | 24,838,298 | 13,783,746 |
| අතිකුත් ගෙවිය යුතු උපචිත වියදම් | **20** | 8,489,175 | 12,069,737 | 11,218,848 |
| බැංකු අයිරාව | | - | - | 6,108,668 |
| | | **25,079,756** | **39,610,611** | **35,039,870** |
| මුළු හිමිකම් හා වගකීම් | | **640,020,413** | **612,678,447** | **492,672,009** |

2007 අංක 7 දරණ සමාගම් පනතට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකසා ඇති බවට සහතික කරමි.

මූල්‍ය නිලධාරී

මෙකී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරති. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් තබන ලදී.

අධ්‍යක්ෂක

අධ්‍යක්ෂක

2013 අගෝස්තු 30 වන දින
කොළඹ දී ය

පිටු අංක 18 - 26 දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලට අන්තර්ගත වන බව සැලකිය යුතුයි.

**සී/ස ලංකා පොස්පේට් සමාගම**

## 2013 ක් වූ මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

| | නිකුත් කළ ප්‍රාග්ධනය රුපියල් | රඳවාගත් ඉපැයුම් රුපියල් | මුළු හිමිකම් රුපියල් |
|---|---|---|---|
| 01-04-2011 දිනට ශේෂය | 72,510,000.00 | 339,432,103.53 | 411,942,103.53 |
| ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත යොදාගැනීමේදී ඇතිවූ බලපෑම | - | (6,192,052.00) | (6,192,052.00) |
| 01.04.2011. දිනට නැවත සැකසූ ශුද්ධ ලාභය | 72,510,000.00 | 333,240,051.53 | 405,750,051.53 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය ( නැවත සැකසූ) | - | 129,805,176.86 | 129,805,176.86 |
| **වෙනත් විස්තිර්ණ ආදායම්** | | | |
| නිශ්චිත ප්‍රතිලාභ මත ආයුගණන ආදායම | - | 14,195,732.84 | 14,195,732.84 |
| **කොටස්කරුවන් සමග වූ ගණුදෙනු** | | | |
| ලාභාංශ ගෙවීම් | - | (20,000,000.00) | (20,000,000.00) |
| 31-03-2012 දිනට ශේෂය | 72,510,000.00 | 457,240,961.23 | 529,750,961.23 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | 79,535,772.85 | 79,535,772.85 |
| **වෙනත් විස්තිර්ණ ආදායම** | | | |
| නිශ්චිත ප්‍රතිලාභ මත ආයුගණන ආදායම | - | 18,614,321.14 | 18,614,321.14 |
| **කොටස්කරුවන් සමග වූ ගණුදෙනු** | | | |
| ලාභාංශ ගෙවීම් | - | (40,000,000.00) | (40,000,000.00) |
| 31-03-2013 දිනට ශේෂය | 72,510,000.00 | 515,391,055.23 | 587,901,055.23 |

පිටු අංක 18 - 26 දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලට අන්තර්ගත වන බව සැලකිය යුතුයි.

**සී/ස ලංකා පොස්ජේට් සමාගම**

## 2013 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන | 31.03.2013<br>රුපියල් | 31.03.2012<br>රුපියල් |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | | |
| බදු පෙර ලාභය | | 118,247,984 | 188,460,539 |
| **ගැලපීම්** | | | |
| ක්ෂයවීම් | | 7,841,011 | 8,165,100 |
| පාරිතෝෂික දීමනා වෙන්කිරීම | | 6,194,069 | 8,507,722 |
| පොලී ආදායම් | | (48,616,904) | (37,507,732) |
| දේපළ පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ලාභය | | (3,468,000) | |
| ලාභාංශ ආදායම් | | (540,000.00) | (450,000.00) |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | | **79,658,160** | **167,175,629** |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්** | | | |
| තොග (වැඩිවීම්)/ අඩුවීම් | | (18,176,490) | (28,388,416) |
| වෙළඳ ලැබිය යුතු දෑ (වැඩිවීම්)/ අඩුවීම් | | (6,081,106) | (1,977,100) |
| තැන්පත්, ඉදිරියට කළ ගෙවීම් ලැබිය යුතු අනිකුත් දෑ (වැඩිවීම්)/ අඩුවීම | | 4,263,097 | 857,209 |
| ණයහිමියෝ (අඩුවීම) / වැඩිවීම් | | 6,646,868 | (1,226,033) |
| උපචිත වියදම් හා වෙනත් ගෙවිය යුතු වියදම් (අඩුවීම) / වැඩිවීම් | | (3,580,562) | 850,890 |
| **මෙහෙයුම් වලින් ජනනය වූ මුදල්** | | **62,729,967** | **137,292,178** |
| ආදායම් බදු / ආර්ථික සේවා අයකිරීම්/ රඳවාගැනීමේ බදු ගෙවීම් | | (51,343,771) | (44,412,367) |
| විශ්‍රාමික පාරිතෝෂික ගෙවීම් | | (3,857,020) | (2,877,203) |
| **මෙහෙයුම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **7,529,175** | **90,002,609** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| දේපළ, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිළදී ගැනීම් | | (4,763,392) | (25,903,906) |
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ එකතුව | | (2,744,578) | (36,282,403) |
| ආයෝජනවල එකතුව | | 956,168 | (68,961) |
| කෙටිකාලීන තැන්පතු වල එකතුව | | (23,774,421) | (46,683,311) |
| පොලී ලැබීම් | | 48,616,904 | 37,507,732 |
| ලාභාංශ ලැබීම් | | 540,000 | 450,000 |
| විකුණූ වත්කම්වලට ලද මුදල් | | 3,468,000 | - |
| ණය ප්‍රාග්ධනය අයකර ගැනීම | | 2,847,260 | 2,409,220 |
| **ආයෝජන වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **25,145,941** | **(68,571,629)** |

**මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය**

| | | | |
|---|---|---|---|
| ලාභාංශ ගෙවීම් | **17** | (40,000,000.00) | (20,000,000.00) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලට යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(40,000,000.00)** | **(20,000,000.00)** |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වෙනස** | | **(7,324,884)** | **1,430,981** |
| වර්ෂයේ මුල මුදල් සහ මුදල් සමාන දෑ | **21.1** | 45,666,638 | 44,235,657 |
| වර්ෂය අග මුදල් සහ මුදල් සමාන දෑ | **21.2** | **38,341,754** | **45,666,638** |

පිටු අංක 18 - 26 දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලට අන්තර්ගත වන බව සැලකිය යුතුයි.

## වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

### 1. සංස්ථාපිත තොරතුරු

### 1.1 පොදු තත්ත්වය

රාජ්‍ය පතල් හා ඛණිජ සංවර්ධන සංස්ථාවේ එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය පවරා ගැනීම සඳහා 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර පොදු සමාගම් බවට පත් කිරීමේ පනතට අනුව සීමාසහිත ලංකා පොස්පේට් සමාගම සීමාසහිත වගකීම් සහිත සමාගමක් වශයෙන් 1992 ජූලි 10 වන දින සංස්ථා ගත කරන ලදි. කෙසේ නමුත් මෙම ආයතනය 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරනු ලැබිය.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 14, නව කැළණි පාලම පාරේ, අංක 73-1/1 දරණ ස්ථානයෙහිද, පාෂාණමය පොස්පේට් (ඇපටයිට්) නිධිය එප්පාවලද පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ බහු වාර්ගික භෝග සඳහා පොහොර වශයෙන් යොදා ගන්නා පොස්පේට් කැනීම් සිදු කිරීම, සකස් කිරීම, හා පාෂාණ අලෙවි කිරීමයි.

### 1.3 නිකුත් කිරීම සඳහා අනුමැතිය දුන් දිනය

2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 අගෝස්තු 30 දින අනුමැතිය දෙන ලදි.

### 2 පිළියෙල කිරීමේ පදනම

සමාගමේ මූල්‍ය ප්‍රකාශණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය, විස්තිරණ ආදායම් ප්‍රකාශණය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශණය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශණය සමග වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන්වල සාරාංශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුව සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වන ලෙස පිළියෙල කර ඇත.

සමාගම එහි 2012 මාර්තු 31 දිනෙන් අවසන් කාලච්ඡේදයට අදාල මූල්‍ය වාර්තා සමඟ පසුගිය කාලච්ඡේද වලට අයත් මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව පිළියෙල කර තිබූ අතර 2012 මාර්තු 31 දක්වා එය බලපැවැත්වූනි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිකරණ ආයතනය විසින් 2012 ජනවාරි 1 දින සහ ඉන් පසුව බලපවත්වන පරිදි එම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත කාණ්ඩයක් නිකුත් කර ඇත. මෙම නව ප්‍රමිත, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වලට අනුරූපව) සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිත) වලට අනුරූපව ලෙස උපසර්ගකොට ගිණුම්කරණ ප්‍රමිත වල අන්තර් ගත වේ. ඒ අනුව 2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශණ 2012 ජනවාරි 01 දිනසිට බල පවත්වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කළ හා ඉදිරිපත් කළ ප්‍රථම මූල්‍ය ප්‍රකාශණ වේ.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වලට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කරනවිට සමාගම කලින් වාර්තාකරණ ලද මූල්‍ය කාලපරිච්ඡේදය සඳහා අවශ්‍ය ගැලපීම් සහ කලින් වාර්තා කරන ලද අයිතම වලට ප්‍රමානාත්මක බලපෑමක් වන පරිදි වලට පරිවර්තනය කිරීමේදී වූ බලපෑම් සැසඳුම් ප්‍රකාශණයේ සහ අයිතමයන්ට අදාල සටහන් තුල ඉදිරිපත් කර ඇත. 2012 මාර්තු 31 අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වලට අනුව පිළියෙල කළ සමාගමේ මූල්‍ය ප්‍රකාශණ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වලට පරිවර්තනය කිරීමේදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශණයට ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සැලකිය යුතු වෙනස්කම් සහ ස්වභාවය මත සිදුවූ බැලපෑම් මෙම මූල්‍ය ප්‍රකාශණ වලට සටහන 21 අනාවරණය කරයි.

### 2.2 ගිණුම්කරණ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශණයේ අඩංගු පහත සඳහන් ප්‍රමාණාත්මක අයිතමයන් හැර මූල්‍ය ප්‍රකාශන, ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන පිළියෙල කර ඇත.

විකිණීම සඳහා තබා ඇති මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට මණිනු ලබයි.

නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ වගකීම නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ වර්තමාන වටිනාකම ලෙස හඳුන්වනු ලබයි.

## 2.3 ඉදිරිපත් කිරීමේ සහ ක්‍රියාකාරී ව්‍යවහාරික මුදල්

සමාගමේ ඉදිරිපත් කිරීමේ හා ක්‍රියාකාරී ව්‍යවහාර මුදල් ලෙස ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කර ඇත. සියලුම මූල්‍ය ප්‍රකාශණ ආසන්නම රුපියලට වැටයු ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

## 2.4 සංසන්දනාත්මක තොරතුරු

සමාගම විසින් නව වෙනස්වීමේ ප්‍රතිඵලයක් ලෙස වෙනස් වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වල ඇතුලත්විම් හැර පෙර වර්ෂවල ගිණුම්කරණ ප්‍රතිපත්ති LKAS 01 - මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කිරීමේ ප්‍රමිතයට අනුව අඛණ්ඩව ඇතුලත් කර ඇත.

## 2.5 ප්‍රමාණාත්මක හා ඒකරාශී කිරීම

LKAS 01 ට අනුකූලව මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කිරීමේදී සමාන අයිතමවල සෑම ප්‍රමාණාත්මක මට්ටමක්ම මූල්‍ය ප්‍රකාශණ තුළ වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

ස්වභාවය හා ශ්‍රිතය සමාන නොවන අයිතම ප්‍රමාණාත්මක වුවද වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම හිලව් කිරීම සහ ශුද්ධ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශණයේ වාර්තා කිරීම පහත අවස්ථාවලදී පමණක් සිදුකළ හැකියි.

එහි හඳුනාගත් වටිනාකම හිලව් කිරීමට නිත්‍යානුකූලව බලාත්මක කල හැකි අයිතියක් තිබිම.

එහි ශුද්ධ පදනමක් මත පියවිමේ අභිප්‍රායක් තිබීම.

සමකාලීන ලෙස අවබෝධ කරගන්නා වත්කම් හා වගකීම් පියවීම.

ගිණුම්කරණ ප්‍රමිත හෝ අර්ථකථන මගින් අවශ්‍ය වන විට හෝ අවසර ලබාදෙන විට හෝ ගිණුම් ප්‍රතිපත්තීන් වල නිශ්චිතව අනාවරණය කළ විට හෝ හැර ආදායම් හා වියදම් ආදායම් ප්‍රකාශණය තුළ හිලව් කිරීම කළ නොහැක.

# 3. සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්වයන් ඇස්තමේන්තුගත කිරීම් සහ උපකල්පනයන්

මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීම සඳහා අනාගතයට අදාල යම් යම් තිරණාත්මක ගිණුම්කරණ උපකල්පනවල භාවිතය අවශ්‍යවේ. තවදුරටත් වාර්තාකරණ කාලය අවසානයේදී අදායම්, වියදම්, වත්කම් සහ වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්වල අනාවරණය කිරීම් වල වටිනාකම් වාර්තාකිරීමට බලපාන විනිශ්වයන් ඇස්තමේන්තු ගත කිරීම් හා උපකල්පන ඇතිකර ගැනීමට සමාගමේ කළමණාකරණයට මෙය අවශ්‍ය වේ.

කෙසේවුවද උපකල්පන හා ඇස්තමේන්තු ගත කිරීම් පිළිබඳව අවිනිශ්චිතතාවයන් අනාගත කාල පරිච්ජේදය තුළ වත්කම් හා වගකීම් වල ධාරණ වටිනාකමේ අවසාන ප්‍රමාණාත්මක ගැලපීම් වලට අවශ්‍ය විය හැකිය.

එම නිසා සත්‍ය පලපුරුද්ද හා ප්‍රතිඵලය මෙම විනිශ්වයන් හා ඇස්තමේන්තු වලින් වෙනස්විය හැකිය.

සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ඇතුලත් කිරීමේ ක්‍රියාවලියේදී මූල්‍ය ප්‍රකාශණ තුළ වටිනාකම් හඳුනාගැනීමේදි වඩාත් සැලකිය යුතු බලපෑමක් ඇතිකරන පහත සඳහන් විනිශ්වයන් තක්සේරු හා උපකල්පන කළමණාකරණය විසින් ගනු ලබයි.

### a) බදුකරණය

සමාගම අදායම් බදු සහ වෙනත් බදු වලට යටත්වේ. බදු අයකිරීමේ අරමුණ සඳහා බද්දට යටත් ලාභ සහ මූල්‍ය ප්‍රකාශණ තුළ විසඳීමට තිබෙන බදු මාර්ගෝපදේශක ගැටළු විසඳීම් මත SLFRS වල ඇතුලත් කිරීම මුලු වර්තමාන වෙන්කිරීම් විලම්භිත හා වෙනත් බදු තීරණය කිරීමට සැලකිය යුතු විනිශ්වයක් අවශ්‍යවේ.

මෙම මූල්‍ය ප්‍රකාශණ පිළියෙළ කරන කාලයේදී බදු නීතියේ ඇතුලත් කිරීම් අර්ථකථන කිරීමේදී අවිනිශ්චිත න්‍යායන් පවතී.

සමාගම වර්තමානය සඳහා වත්කම් හා වගකීම් මත විලම්භිත බදු සහ වෙනත් බදු හඳුනාගනුයේ අතිරේඛ බදු පවතීද යන තක්සේරුව මත වේ.

අවසාන බදු ප්‍රතිඵලයේ වගකීම මූලික සටහන් වලින් වෙන්වීමේදී එම වෙනස තීරණය කරන ලද කාලපරිච්ඡේදය තුළ ආදායම් විලම්භිත සහ බදු වටිනාකමට බලපානු ලබයි.

### b) දේපළ සහ උපකරණ වල ඵලදායි ජීවිත කාලය

සමාගම විසින් සෑම වාර්තාකරණ දිනයකම සුන්බුනු අගය ඵලදායි කාලය හා ක්ෂය කිරීමේ ක්‍රමය විමර්ශණය කරයි. කළමණාකරණයේ විනිශ්චයන් මත වටිනාකම් අනුපාත ක්‍රම භාවිතා කරනු ලබන අතර එමනිසා ඔවුන් අවිනිශ්චිතාතාවයන්ට යටත්වේ.

### c) අඛණ්ඩ පැවැත්ම

සමාගම විසින් සමාගමේ පවත්වාගෙන යාමේ හැකියාව නොහොත් අඛණ්ඩ පැවැත්ම තක්සේරු කරනු ලබන අතර ව්‍යාපාරය අනාගත අවිනිශ්චිත කාලයක් අඛණ්ඩව කරගෙන යාමට අවශ්‍ය සම්පත් තිබේද යන්නත් පිළිබඳ සලකාබලයි.

තවදුරටත් ක්‍රියාකාරී ව්‍යාපාරයක් ලෙසට දිගින් දිගටම පවත්වා ගැනීමට ඇති හැකියාව පිළිබඳව සාධාරණ සැකයක් ජනිත විය හැකි කිසියම් වූ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලයට දැනීමක් නොමැත. එසේ හෙයින් සමාගමේ ක්‍රියාකාරකම් නවතා දැමීමට හෝ ද්‍රවශීල කිරීමට අදහසක් නොමැත.

එමනිසා මූල්‍ය ප්‍රකාශණ අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙල කරනු ලබයි.

### d) මූල්‍ය වත්කම් මත හානිකරණ අලාභ

අදායම් ප්‍රකාශය තුළ හානිකරණ අලාභ වාර්තා කළයුතුද නැද්ද යන්න පිළිබඳව යම්කිසි හරාත්මක සාක්ෂි පවතීද යන්න් පිළිබඳ සෑම වාර්තාකරණ දිනයකදීම හෝ නිරන්තරව සමාගම විසින් අගය කරයි.

### e)විකිණීම සඳහා පවතින ආයෝජන හානිකරණය

සමාගම විසින් සෑම වාර්තාකරණ දිනයකදීම විකිණීම සඳහා පවතින ආයෝජන ලෙස හඳුන්වන කොටස් අරමුදලට දෙනු ලබන එහි ණය හානිකරණය වී ඇතිද යන්න විමර්ශණය කරයි.

### f) විලම්භිත බදු වත්කම්

විලම්භිත බදු වත්කම් හඳුනාගනුයේ යම් ප්‍රමාණයකට භාවිතා නොකල බදු අලාභ සහ බදු බැර පවතින බදු අයකළ හැකි ලාභයට එරෙහිව භාවිතා කළ හැකිනම් පමණි. අනාගත සැසඳුම් උපක්‍රම වන විලම්භිත බදු වත්කම් වටිනාකම විනිශ්චය කිරීමට සුදුසු වේලාව සහ අනාගත බදු අයකළ හැකි ලාභ මට්ටම මත සැලකිය යුතු කළමනාකරණ විනිශ්චයන් අවශ්‍ය වේ.

### g) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වල ධාරන අගය තීරණය කරනු ලබන්නේ ආයුගණක උපකල්පන සලකාබලන සූත්‍රයක් භාවිතා කරමින්ය. මෙහි අනාගතයේ සිදුවන සත්‍ය සංවර්ධනයන්ගෙන් වෙනස්වූ විවිධ උපකල්පනයන් ඇතුලත් වේ.

මෙහි ඇතුලත් වනුයේ වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිකිරීම්, මරණ අනුපාතය යනාදියවේ. අගය කිරීමේ සංකීර්ණතාවය පාදකවූ උපකල්පන හා එහි දිගු කාලීන ස්වභාවය හේතු කොටගෙන මෙම උපකල්පන වල වෙනස්වීම නිශ්චිත ප්‍රතිලාභ සැලසුමකදී ඉතා සංවේදී වේ. සියළුම උපකල්පන සෑම වාර්තා කරන දිනයකදීම නිරීක්ෂණය කරනු ලබයි. යෝග්‍ය වට්ටම් අනුපාත තීරණය කිරීමේදී නිශ්චිත ප්‍රතිලාභ බැඳීයාව බලාපොරොත්තුවන කාලයට යෝග්‍යවන තක්සේරු කරන කල්පිරීම සමග ශ්‍රී ලංකා රාජ්‍ය බැඳුම්කරණ ප්‍රතිලාභ කළමණාකරණය විසින් සලකාබලනු ලබයි. අනාගත වැටුප් වැඩිවීම්, සමාගමේ අපේක්ෂිත අනාගත වැටුප් වැඩිවීම් අනුපාතය සහ අනාගත අපේක්ෂිත උද්ධමන අනුපාතය මත තීරණය කරයි.

## 4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් වල සාරාංශය

මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීමේදී සමාගම විසින් යොදාගනු ලබන සැලකියයුතු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහත සඳහන් වේ.

පහත සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අඛණ්ඩව සියළුම කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කිරීමේදී යොදාගනු ලබන අතර SLFRS වල පරිවර්තන අරමුණ සඳහා 2011 අප්‍රේල් 01 දිනට ආරම්භක මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය පිළියෙල කරනු ලබයි.

### 4. 1. ආදායම හඳුනාගැනීම

#### 4. 1.1. භාණ්ඩ විකුණුම්

සමාගම අදායම් හඳුනාගනු ලබන්නේ එම ආදායමේ වටිනාකම පැහැදැලිව හඳුනාගත හැකි විටදී සහ එහි අනාගත අතිරේඛ ප්‍රතිලාභ ආයතනය තුලට ගලාඒමේ හැකියාව ප්‍රත්‍යක්ෂ විටදී පමණි. ආදායම මනිනු ලබනුයේ ප්‍රතිශ්ඨාව ලැබීමේ හෝ ශුද්ධ වෙළඳ මට්ටම සහ විකුනුම් බදු ලැබීමේ ශුද්ධ අගය මතයි. පහත සඳහන් සියළුම කොන්දේසි සම්පූර්ණ කරන විට භාණ්ඩ විකුණුම් වලින් ආදායම හඳුනාගනී

a) විකුණනු ලබන භාණ්ඩ වලට අදාල සියළුම අවදානම් හා ප්‍රතිලාභයන් පරිභෝගිකයා වෙත බාරදෙනු ලබන අවස්ථාවේදී
b) භාණ්ඩ විකිණීම මත ඵලදායි පාලනයක් හෝ අයිතිකරුවන් සමග සාමාන්‍යයෙන් පවතින ආශ්‍රයට අඛණ්ඩව කළමණාකරණය ඇතුළත්වීම සමාගම විසින් රඳවා ගැනීම.
c) ආදායමේ වටිනාකම විශ්වාස කළ හැකි ලෙස මැනිය හැකි වීම සහ ආයතනයට ගලා එන ගනුදෙනු සමග ආර්ථික ප්‍රතිලාභ ලබාගත හැකිවීම සහ
d) පිරිවැය ජනනය වීම හෝ ගනුදෙනුවට අදාලව ඇතිවීම සාධාරණ ලෙස මැනිය හැකිවීම.

#### 4.1.2. පොළී ආදායම

පොළී ආදායම හඳුනාගනු ලබන්නේ සඵලදායි පොළී අනුපාතය ක්‍රමය භාවිතාකොට ගෙනය.

#### 4.1.3. ලාභාංශ ආදායම

ලාභාංශ ආදායම හඳුනාගනු ලබන්නේ සමාගම පිහිටුවන ලද ලාභාංශ ලැබීමට අයිතය දල විට විස්තිර්ණ ආදායම් ප්‍රකාශය තුල උපචිත පදනමටය.

#### 4.1.4. වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනමට හඳුනාගනු ලබයි.

### 4.2 වියදම් හඳුනාගැනීම

වියදම් හඳුනාගනු ලබන්නේ පිරිවැය ඇතිවීම සහ විශේෂිත අයිතමයක ආදායම් ඉපයීම් අතර ඍජු සම්බන්ධයේ පදනම මත ආදායම් ප්‍රකාශය තුළය.

සියළුම වියදම් ව්‍යාපාරය කරගෙන යාමේදි ඇතිවන අතර දේපළ පිරියත උපකරණ ඵලදායි ආකාරයෙන් පවත්වාගෙන යාම තුල ඇතිවන අයකර ගැනීමද ආදායම් ප්‍රකාශයතුල හඳුනාගනී. ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණු සඳහා සමාගමේ කාර්‍යසාධනයේ සාධාරණ අගය ඉදිරිපත් කිරීමේ පදනම මත “වියදම් ශ්‍රිත” පදනමට ඇතුලත් කර ඇත.

ආදායම් බදු වියදම මත ජංගම හා විලම්භිත බදු ඇතුලත්වේ.

### 4.3 බදුකරණය

#### 4.3.1. ජංගම බදු

ජංගම බදු වත්කම් හා වගකීම් තුල පෙර වර්ෂයට අදාල ගෙවියයුතු බදුවලට යම්කිසි ගැලපීම් හෝ ආදායම් බදු කොමසාරිස් ජනරාල් වෙතට, ආවරණය කර ගැනීමට හෝ බලාපොරොත්තු වන වටිනාකම හෝ ගෙවීමට බලාපොරොත්තු වන වටිනාකමයි. වාර්තාකරණ දිනට නිතිගත කර ඇති හෝ ඊට පසුව නිතිගත කර ඇති බදු නිති සහ බදු අනුපාත යොදා ගනිමින් වටිනාකම ගණනය කරනු ලබයි.

#### 4.3.2. විලම්භිත බදු

විලම්භිත බදු පනවනු ලබන්නේ මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා බදුවල ධාරණ අගය සහ වත්කම් සහ වගකීම් වල බදු පදනම අතර වාර්තාකරන දිනට පවතින තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමය යොදාගනිමින්ය.

සියළුම අඩුකළ හැකි වෙනස්කම් සඳහා විලම්භිත බදු වත්කම් හඳුනාගනී. භාවිතා නොකරන බදු බැර වල ඉදිරියට ගෙනයාම සහ භාවිතා නොකළ බදු අලාභ යම් ප්‍රමාණයකට අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් පවතින බදු අයකළ හැකි ලාභයට එරෙහිව ලබාගත හැකි බව හෝ භාවිතා නොකළ බදු අලාභ භාවිතා කල හැකි විය යුතුයි.

සෑම වාර්තාකරණ දිනකටම විලම්භිත බදු වත්කමේ ධාරණ අගය විමර්ෂණය කරනු ලබන අතර විලම්භිත බදු වත්කමේ මුළ අගය හෝ කොටසක් ප්‍රමාණවත් බදු අයකළ හැකි ලාභයෙන් තවදුරටක් යම් ප්‍රමාණයක් දක්වා අඩුකරනු ලබයි. හඳුනාගත නොහැකි විලම්භිත බදු වත්කම් සෑම මූල්‍ය තත්ත්ව ප්‍රකාශණ දිනයකම නැවත අගය කරනු ලබන අතර අනාගත බදු අයකළ හැකි ලාභය, විලම්භිත බදු වත්කම ආවරණය කර ගැනීමට ඉඩදේ නම් තවදුරටත් යම් ප්‍රමාණයකට හඳුනාගත හැකිය. විලම්භිත බදු වත්කම් හා වගකීම් නීතිගත කරන ලද හෝ පසුකාලීනව නීතිගත කරන ලද බදු නීතිරීති සහ බදු අනුපාතවලට අනුව වත්කම් හඳුනාගැනීම හෝ වගකීම් නිරාකරණය කරගත් විට වර්ෂය තුළ යොදාගැනීමට අපේක්ෂා කරන බදු අනුපාතයට අගය කරනු ලබයි.

## 4.4. මූල්‍ය නොවන වත්කම්

### 4.4.1. දේපළ සහ උපකරණ හඳුනාගැනීම සහ මැනීම

ව්‍යාපාරයට ගලා එන වත්කම් සමඟ අනාගත ආර්ථික ප්‍රතිලාභ පවතී නම් සහ වත්කමේ පිරිවැය LKAS 16 දේපළ, පිරියත හා උපකරණ ප්‍රමිතයට අනුව සාධාරණව මැනිය හැකිවිට දේපළ සහ උපකරණ හඳුනාගනු ලබයි.

**පිරිවැය ආකෘතිය**

දේපළ සහ උපකරණ දෛනික සේවා පිරිවැයන් සහ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරන වටිනාකම අඩුකර පිරිවැයට ප්‍රකාශ කරනු ලබයි. හඳුනාගත්තා ලද උපමානයන් හමුවුනහොත් එම උපකරණයේ පිරිවැය හා ප්‍රතිස්ථාන පිරිවැය එම පිරිවැය තුළ ඇතුළත් කරයි.

**පසුකාලීන පිරිවැය**

පසුකාලීන වියදම් ඇතිවනුයේ ව්‍යාපාරය පවත්වාගෙන යාමේ අදහසින් ස්ථාවර පරිසරය තුල පවතින වත්කම් අත්පත් කර ගැනීම දිර්ඝ කිරීම හෝ වැඩිදියුණු කිරීමේ අරමුණු සඳහාය. දේපළ පිරියත උපකරණ වල දෛනිකව ඇතිවන සේවාවල පිරිවැය ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනියි.

**ක්ෂයවීම්**

ක්ෂයවීම් ගණනය කරනුයේ දේපළ සහ උපකරන වල පිරිවැයේ ලියාහල අගය ඒවායේ සුන්බුන් අගය සහ ඒවායේ ඇස්තමේන්තු ගත ඵලදායි ජිවිතකාලය පුරා සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින්ය. අනුපාතික ක්‍රමය මත මිලදී ගත්තා ලද දිනයේ සිට විකුණනු ලබන දිනට ක්ෂයවීම් ගණනය කරයි.

ඉඩම් ක්ෂය නොකරයි. ඇස්තමේන්තු ගත ඵලදායි ජිවිත කාලයට ක්ෂය අනුපාත පහත පරිදිවේ.

| වත්කම් වර්ගය | ක්ෂය ප්‍රතිශතය (%) |
|---|---|
| ගොඩනැගිලි | 04% |
| පිරියත සහ යන්ත්‍ර | 10% |
| පර්යේෂණාගාර උපකරණ | 10% |
| විදුලි උපකරණ | 10% |
| වෙනත් වත්කම් | 10% |
| මෝටර් රථ | 20% |
| කාර්යාලීය උපකරණ | 20% |
| ගෘහ භාණ්ඩ හා උපකරණ | 20% |
| පරිගණක දෘඩාංග හා මෘදුකාංග | 20% |

**හඳුනානොගැනීම**

දේපළ හා උපකරණ භාවිතා කිරීමෙන් හෝ විකිණීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ නොමැති නම් ඒවා හඳුනානොගනී. වත්කම් හඳුනානොගැනීම (ශුද්ධ විකුණුම් වටිනාකම සහ වත්කමේ ධාරන අගය අතර වෙනස ලෙස ගණනය කරයි) විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වර්ෂය තුල වත්කම් හඳුනානොගැනීම වශයෙන් වෙනත් මෙහෙයුම් යටතේ හඳුනාගනු ලබයි.

**4.4.2 මූල්‍ය නොවන වත්කම් හානිකරණය**
සමාගම විසින් සෑම ගිණුම් කාලච්ඡේදයක් අවසානයේදී එහි වත්කම්හි හානිකරණය සිදුකිරීම සඳහා ඇඟවීමක් ඇත්ද යන්න පිළිබඳ විවරණයක් සිදු කරයි. එම ඇඟවීම් පවතින්නේ නම් හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂාවක් අවශ්‍යවන විට සමාගම විසින් වත්කමේ නැවත අයකරගත හැකි අගය ඇස්තමේන්තු කරයි.

**4.5 මෙහෙයුම් කල්බදු**
කල්බදු හිමියා විසින් කල්බදු කාලය පුරා අයිතියේ ප්‍රතිලාභ සහ සියළුම පසුකාලීන අවධානම් ඵලදායිව රඳවා ගනී නම් එවැන්නක් මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කරයි. මෙහෙයුම් කල්බදු ගෙවීම් කල්බදු කාලය පුරා සරල මාර්ග ක්‍රමයට වියදමක් ලෙස හඳුනාගැනීම හෝ කල්බදු වත්කම් භාවිතාකිරීමෙන් ලැබෙන ආර්ථික ප්‍රතිලාභ ගලාඑන කාලපිළිවෙලේ නිරූපණය මත හඳුනාගනු ලබයි.

**4.6 තොග**
පොස්පේට් තොග අගය කරනු ලබන්නේ නිෂ්පාදන පිරිවැය මත පදනම්ව බරතැබූ සාමානය ක්‍රමය මතයි. පොස්පේට් තොග අගය කරන විට පහත සඳහන් භාවිත විභජනය යොදා ගනී.

පතල් නිෂ්පාදන පිරිවැයෙන් **40%** ක් නිෂ්පාදනයටද (ක්‍රියාවලිය සිදුනොවන) ඉතිරි **60%** ශ්‍රම පිරිවැයටද වේ. සාමාන්‍ය තොග අගය ප්‍රකාශයට පත්කළ යුත්තේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්වලින් අඩු අගයටයි. සාමාන්‍ය ක්‍රමයට පිරිවැය බරතැබූ සාමාන්‍ය හඳුනාගනු ලබයි. ශුද්ධ උපලබ්ධි අගය වනුයේ පිරිවැය උපලබ්ධි කිරීම සඳහා අවසර දීමෙන් පසුව සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී විකිණීමට තබා ඇති තොගවල මිල ගණන් අනුවය. යල්පැනගිය, මන්ද සංචලන සහ දෝෂ සහිත තොග සඳහා අවශ්‍ය වෙන්කිරීම් සිදුකරනු ලබයි.

**4.9 මූල්‍ය වත්කම් හඳුනාගැනීම සහ මැනීම**

**4.9.1. මූල්වරට හඳුනාගැනීම**
සියලුම මූල්‍ය වත්කම් මූල්වරට හඳුනා ගතයුත්තේ ගණුදෙනුව මූල්වරට උත්පාදනය කල දිනයේදීය. උදාහරණ වශයෙන් සමාගම නිත්‍යානුකූල ලේඛණයක ගිවිසුම්ගත වෙන්කිරීමකට පාර්ශවයක් ලෙස සහභාගීවීම. මෙය තුල සාමාන්‍ය වෙළඳාම ඇතුලත්වේ. තවද මෙය තුළ වෙළඳපල තුළ නීති හෝ සම්මුති මගින් පොදුවේ පිහිටුවන කාලපරාසයක් තුල වත්කම් බෙදාහැරීමට අවශ්‍ය මූල්‍ය වත්කම් මිලදී ගැනීම හෝ විකිණීමද ඇතුලත් වේ.

**4.9.2. මූල්වරට මැනීම**
මූල්වරට හඳුනාගන්නා මූල්‍ය උපකරණ වර්ගීකරණය පදනම් වනුයේ ඒවායේ අරමුණු මත සහ ගුණාංග සහ ඒවා අත්පත්කර ගැනීමට කළමණාකරණය දරන අරමුණු මතයි. සියළුම මූල්‍ය උපකරණ මූල්වරට මනිනු ලබන්නේ මූල්‍ය වත්කම් වල ගනුදෙනු පිරිවැය සහ ලාභ අලාභ අතරින් සාධාරන අගය සහිත මූල්‍ය වගකීම් හැර ගනුදෙනු පිරිවැය ඇතුලත්ව එහි සාධාරණ අගය වේ.

**4.9.3. පසුකාලීනව මැනීම**
සමාගම පසුකාලීනව මූල්‍ය වත්කම් වර්ගීකරණයට ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වර්ගකරමින් මැනීම සිදුකරයි. ඒවා පහත ආකාරයට වේ.
- සාධාරණ වටිනාකමට ලාභ අලාභ
- කල්පිරීමට පවතින ආයෝජන
- ණය සහ ලැබිය යුතු
- විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්

**i) සාධාරණ වටිනාකමට ලාභ අලාභ**
මූල්‍ය වත්කම විකිණීම සඳහා පවතී නම් හෝ සාධාරණ වටිනාකම වන ලාභ අලාභ ලෙස නම් කර ඇත්නම් හෝ සාධාරණ වටිනාකමට ලාභ අලාභ ලෙස මූල්‍ය වත්කම් වර්ගීකරණය කරයි.

**ii) කල්පිරීම සඳහා පවතින මූල්‍ය ආයෝජන**
සමාගමට කල්පිරීමට තබා ගැනීමේ හැකියාව හෝ අරමුණ පවතින, ස්ථිර කල්පිරීමේ කාලයක් සහ ස්ථිර හෝ නිශ්චිත ගෙවීමක් සමග පවතින ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් කල්පිරීම සඳහා පවතින මූල්‍ය ආයෝජන ලෙස හඳුන්වයි.

මූල්වරට මැනීමෙන් පසුව කල්පිරීම සඳහා පවතින මූල්‍ය ආයෝජන හානිකරණය අඩුකර, ඵලදායි පොලී අනුපාතය භාවිතාකරමින් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබයි.

**iii) ණය සහ ලැබිය යුතු**

ක්‍රියාකාරී වෙළඳපොලතුළ ප්‍රකාශ නොවන නිශ්චිත ගෙවීමක් හෝ ස්ථාවර ගෙවීමක් සමග පවතින පහත සේවා හැර ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු වල අඩංගු වේ.

- ඉක්මණින් විකිණීමට සමාගමට අරමුණක් ඇති හෝ ආසන්න කාලයේදී විකිණීමට අරමුණක් ඇති සහ මූලික හඳුනාගැනීමේදී සාධාරණ වටිනාකමේ ලාභා අලාභයට ලෙස හඳුනාගෙන තිබීම.

- විකිණීම සඳහා ඇති ලෙස මූලික හඳුනාගැනීමේදී සමාගම විසින් නම් කර තිබීම.

- ණය තරක අතට හැරීම නිසා හැර එහි මූලික ආයෝජන සියල්ලම පසුකාලීනව සමාගමට නැවත අයකරගත නොහැකිවීම.

මූලික මිනුම් කිරීමෙන් පසුව, ණය සහ ලැබිය යුතු දෑ පසුකාලීනව මනිනු ලබන්නේ හානිකරණය සඳහා දීමනා අඩුකළ ඵලදායි පොලී අනුපාත ක්‍රමය භාවිතාකරමින් ක්‍රමක්ෂය පිරිවැයට වේ. ක්‍රමක්ෂයට පිරිවැය මනිනු ලබන්නේ, අත්පත් කරගැනීම් මත වට්ටම් හෝ අධිහාර ගිණුම් තුළට ගෙන සහ ඵලදායි පොලී අනුපාතයේ කොටසක් වන අයකිරීම් සහ පිරිවැය ගිණුම් තුළට ගැනීමෙනි. ක්‍රමක්ෂය, ආදායම් ප්‍රකාශයේ "පොලී ආදායම්" තුළ ඇතුලත් වේ. හානිකරණ වලින් පැනනගින අලාභ, ආදායම් ප්‍රකාශය තුළ ණය සහ ලැබිය යුතු දෑ හානිකරණ ලාභ (අලාභ) තුළ හඳුනාගනී. සමාගම යම් යම් ණය දෙන පෙළඹවීම් වලට ඇතුලත්වී ඇති වෙළඳාම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කිරීමට බලාපොරොත්තුවෙන්, ණය කෙටි කාලයක් තුළ විකිණීමේ අරමුණ නිසා මෙම ණය දීමේ පෙළඹවීම ව්‍යත්පන්න ලෙස වාර්තාකරන අතර සධාරණ අගයකට ලාභ අලාභයෙන් මනිනු ලබයි. සමාගම විසින් පෙළඹවීම් මත රඳවා තබාගැනීමට පෙළඹවීම සහ කෙටිකාලයේදී අභිප්‍රාය ඇති අලාභ ලැබීමට ඉඩඇති කරදර සහිත ගිවිසුමක් වන විට පෙළඹවීමක් ලෙස වාර්තාකරයි.

**විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන**

විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන තුළ සේවකයන්ගේ කොටස් විශ්වාසී අරමුදලට දෙන ලෙස ණය ඇතුලත්වේ. විකිණීම සඳහා පවතින දෑ, වෙළඳාම සඳහා පවතින හෝ සාධාරණ අගයට ලාභ අලාභයෙන් ලෙස වර්ගීකරණය කර ඇත. සමාගම කිසිදු ණය සහ ලැබිය යුතු දෑ විකිණීම සඳහා පවතින ලෙස නම්කර නොමැත.

මූලික මැනීමෙන් පසුව, විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන සාධාරණ අගයට මනිනු ලබයි. ලබානොගත් ලාභය සහ වියදම් සෘජුව හිමිකම්තුළ (වෙනත් විස්තීර්ණ ආදායම්), විකිණීම සඳහා විකුණුම් සංචිත තුළ හඳුනාගනු ලබයි. ආයෝජන නිදහස්වන විට, පෙරදී හිමිකම තුල හඳුනාගත් ආදායම් ප්‍රකාශයේ වෙනත් මෙහෙයුම් ආදායම් තුළ සමුච්චිතත වාසි සහ අලාභ හඳුනාගනී.

**4.9.4. මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය**

යම් යම් කාරණා යටතේ මූලික හඳුනා ගැනීමේදී ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය අනුව වාර්තාවන ව්‍යුත්පන්නයන් ලෙස හඳුනාගත් ඒවා හැර ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරනු ලබයි.

- වෙළඳාම සඳහා පවතින වර්ගය තුළ සහ විකිණීම සඳහා පවතින, ණය සහ ලැබිය යුතු දෑ හෝ කල්පිරීමට තබා ඇති වර්ගය.

- "විකිණීම සඳහා පවතින" වර්ගය තුළ සහ "ණය සහ ලැබිය යුතු දෑ", "වෙළඳාම සඳහා පවතින වර්ගය" තුලට හෝ "කල්පිරීමට තබා ඇති" දෑ තුල පවතින දෑ.

නැවත වර්ගීකරණය වාර්තාකරණුයේ නව ක්‍රමක්ෂය පිරිවැය ලෙසට ඇතිවූ නැවත වර්ගීකරණය කල දිනයේ සධාරණ අගයට වේ. විකිණීම සඳහා පවතින ඒවා තුල මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කිරීම සඳහා සඵල පොලී අනුපාතය භාවිතාකරමින් ආයෝජන පවතින ජීවිතකාලය පුරා ලාභ අලාභයට ක්‍රමක්ෂය ලෙස හිමිකම තුළ වත්කමේ පෙර වාසිය හා අලාභ හඳුනාගනී. නව ක්‍රමක්ෂය පිරිවැය සහ අපේක්ෂිත මුදල් ප්‍රවාහ අතර යම් වෙනසක් පවතින විට සඵල පොලී අනුපාතය භාවිතා කරමින් වත්කමේ පවතින ජීවිතකාලය පුරා ක්‍රමක්ෂය කරනු ලබයි.

- වෙළඳාම සඳහා පවතින වර්ගීකරණය තුළ සහ ණය සහ ලැබිය යුතු දෑ වර්ගීකරණය තුලට නැවත වර්ගීකරණය කරනුයේ, ව්‍යාපාරය අනාගතයේ අවිනිශ්චිත කාලයක් සඳහා මූල්‍ය වත්කම තබාගැනීමට හැකියාව හෝ කල්පිරෙන තුරු තබා ගැනීමේ අරමුණ පැවතීම.

මූල්‍ය වත්කම නැවත වර්ගීකරණය, සහ සමාගම එම මුදල් ලැබීම් නැවත අයකර ගැනීම්වල ඉහලයාමක් ලෙස අනාගත මුදල් ලැබීම් තක්සේරු කර පසුකාලීනව වැඩිවේ නම්, එම ඉහලයාමේ බලපෑම තක්සේරු කළ වෙනස්කමේ දිනයේ සිට සඵලපොලී අනුපාතයට ගැලපීමක් ලෙස හඳුනාගනී.

නැවත වර්ගීකරණය කිරීම කළමණාකරණයේ ඡන්ද විමසීම මත වේ. එමෙන්ම උපකරණ පදනම විසින් උපකරණය මත තීරණය කරනු ලබයි.

**4.9.5. මූල්‍ය වත්කම් හඳුනාගැනීම**

මූල්‍ය වත්කම් (මූල්‍ය වත්කමක ඇතුලත් විය හැකි කොටසක් හෝ සමාන මූල්‍ය වත්කමක සමාගමේ කොටසක් හෝ) පහත අවස්ථාවලදී හඳුනාගනී.

- කල් ඉකුත්වූ වත්කමක මුදල් ගැලීම් ලැබීමට අයිතිය

- සමාගම සතු වත්කමක මුදල් ගැලීම් ලැබීමට ඇති අයිතිය මාරු කිරීම හෝ ප්‍රමාණාත්මක ප්‍රමාදයක් නැතිව තුන්වන පාර්ශවයකට සම්පූර්ණයෙන්ම මුදල් ගැලීම් ලැබීම් ගෙවීමට බැඳියාවක් උපකල්පනය කර තිබීම. එසේ නැතහොත්,

– වත්කමක සියළු අවධානම් සහ ප්‍රතිලාභ පසුකාලීනව මාරුකර තිබීම
– වත්කමක සියළු ආදායම සහ ප්‍රතිලාභ පසුකාලීනව රඳවාගැනීම් හෝ මාරු කිරීම් කර තිබීම.

සමාගම විසින් වත්කමක මුදල් ගැලීම් ලැබීමට ඇති අයිතිය මාරුකර තිබෙන විට හෝ සංස්ථාපනය විනිවිද යාමක් ඇතුලත් කර තිබීම සහ මාරු කර නොමැති වීම හෝ වත්කමක සියළුම අවධානම් සහ ප්‍රතිලාභ පසුකාලීනව රඳවාගෙන තිබීම හෝ වත්කමක පාලනය රඳවාගෙන නොතිබෙන විට සමාගමේ වත්කම් තුල අඛණ්ඩව ඇතුලත්වීම් යම් ප්‍රමාණයක් දක්වා වත්කමක හඳුනාගනී. එමනිසා, සමාගම හවුල් වගකීමක්ද හඳුනාගනී. සමාගම රඳවාගෙන තිබෙන අයිතිවාසිකම් හා බැඳියාවන් මත පදනම්ව මාරුකරන වත්කම් හා හවුල් වගකීම් මනිනු ලබයි. මාරුවන වත්කමක් මත ඇපකරු ආකෘතිය අඛණ්ඩව සම්බන්ධවීම වත්කමක සත්‍ය ධාරණ අගය හෝ සමාගම නැවත ගෙවියයුතු වටිනාකමේ උපරිම අගය යන දෙකෙන් අඩු අගයට මනිනු ලබයි.

**4.9.6. හානිකරණ හඳුනාගැනීම, මැණීම සහ තක්සේරු කිරීම**

සෑම වාර්තාකරණ දිනයකදීම සමාගම විසින් මූල්‍ය වත්කම්වල සාධාරණ අගයට ලාභ අලාභයට ගෙන නොමැති හානිකරණ වල හරාත්මක සාක්ෂි පවතිද නැද්ද යන්න තක්සේරු කරයි. වත්කම් වල මූලික හඳුනාගැනීමට පසුව අලාභ ඇතිවන අවස්ථා හටගැනීමක් හරාත්මක සාක්ෂි මගින් ඔප්පුකරන විට සහ වත්කමක අනාගත මුදල් ගැලීමක් මත අලාභ අවස්ථාවක් ඇතිවීම සාධාරණව තක්සේරු කල හැකිවිට, මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් සමාගමක හානිකරණයක් ඇතිවේ.

සමාගමට එකතුකල නොහැකි බවට සනාථ කර ඇති විට සමාගම විසින් ආයෝජන සහ ණය අත්තිකාරම් ලියාහරිනු ලබයි.

**4.10. මුදල් හා බැංකු ශේෂ**

මුදල් හා බැංකු ශේෂ හඳුනාගනු ලබන්නේ අතැති මුදල් සහ බැංකු ශේෂ වශයෙන්ය. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා මුදල් සහ මුදල් සමාන දෑ වල අතැති මුදල් සහ බැංකු අයිරාවේ නොගෙවූ ශුද්ධ අගයේ බැංකු තැන්පතු අන්තර්ගත වේ. කෙටිකාලීන කල්පිරීම් සමග ආයෝජන, උදාහරණ වශයෙන් මාස තුනක් හෝ අත්පත්කර ගත්දින සිට මාස තුනට අඩු ආයෝජන මුදල් සමාන දෑ ලෙස හඳුන්වයි.
ඒවා සාමාන්‍ය කොටස් හිමිකම් ලෙස වර්ගීකරණය කරයි. හිමිකම් උපකරණ මුදලේ සාධාරණ අගයට හෝ වෙනත් ලද වත්කම් හෝ ලැබිය යුතු වත්කම් වල සාධාරණ අගයට හෝ හිමිකම් උපකරණ නිකුත්කිරීමේ සෘජු ශුද්ධ පිරිවැය සාධාරණ අගයට මනිනු ලබයි.

**4.11. ප්‍රකාශ කළ ප්‍රාග්ධනය**

සාමාන්‍ය කොටස්, හිමිකම් ලෙස වර්ගකරයි. හිමිකම් උපකරණ, මුදලේ සාධාරණ අගයට හෝ වෙනත් වත්කම් ලැබීම් හෝ ලැබිය යුතු දෑ, හිමිකම් උපකරණ නිකුත්කිරීමේ සෘජු ශුද්ධ පිරිවැයට මනිනු ලබයි.

## 4.12. විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාව

### 4.12.1. විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම – පාරිතෝෂිත

සමාගම 1983 අංක12 දරන පාරිතෝෂිත ගෙවීමේ පනත අනුව පාරිතෝෂිත ගෙවීමට බැඳී සිටී.

අඛණ්ඩව සේවා කාලය වර්ෂ 05 සම්පූර්ණ කිරීම මත පමණක් පාරිතෝෂිත ගෙවීමේ බැඳියාවක් එම පනත අනුව පවතී. එම සඳහන් කරන ලද පනත යටතේ සමාගමේ බැඳියාව ආයු ගණන උපකල්පනය සලකා බලන සමීකරණයක් මත පදනම්ව තිරණය කර ඇත. වගකීම බාහිරව අරමුදල් කර නොගනී.

### 4.12.2. නිශ්චිත දායක සැලසුම

නිශ්චිත දායක සැලසුමක් යනු වෙනමම ඒකකයක් තුල ස්ථිර දායකයක් ගෙවන ඒකකයක් සහ වටිනාකම තවදුරටත් ගෙවීමට නිතිමය හෝ වැඩදායක බැඳියාවක් නොමැති ආදී සේවකයන්ගේ ප්‍රතිලාභ සැලසුමකි. නිශ්චිත දායක සැලසුමට දායකත්වය සඳහා බැඳියාව හදුනාගනු ලබන්නේ සේවකයා සේවය කරන කාලයතුල, ආදායම් ප්‍රකාශයේ සේවක ප්‍රතිලාභ වියදම් වශයෙන්ය.

**a) සේවක අර්ථසාධක අරමුදල**

අනුමත අර්ථසාධක අරමුදලට සෑම සේවකයෙකුගේම වැටුප මත සමාගමේ හා සේවකයාගේ දායකත්වය 12% සහ 10% වශයෙන්වේ.

**b) සේවක භාරකාර අරමුදල**

සමාගම විසින් සෑම සේවකයෙකුගේම වැටුප්මත 3%ක දායකත්වයක් සේවක භාරකාර අරමුදලට යොදයි.

## 4.13. මූල්‍ය වගකීම්

### 4.13.1. මූලික හඳුනාගැනීම සහ මැනීම

සමාගම මූල්‍ය වගකීම් වර්ග කරනුයේ සාධාරණ වටිනාකමට ලාභ හා අලාභ වල මූල්‍ය වගකීම් තුලට හෝ සැකසුමක තත්ත්වය සමග හෝ මූල්‍ය වගකීම් නිර්වචනයට අනුව වෙනත් මූල්‍ය වගකීම් ලෙසය.

මූල්‍ය වගකීම්වල ගිවිසුම්ගත පාර්ශවයක් බවට සමාගම පත්වූ විට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල මූල්‍ය වගකීම් හදුනාගනී.

**i) ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය අනුව වාර්තාවන ව්‍යුත්පන්නයන්**

සාධාරණ වටිනාකමට ලාභ අලාභ වල මූල්‍ය වගකීම තුල වෙළදාම සඳහා පවතින හෝ මූලික අවස්ථාවේ නම් කරන ලද මූල්‍ය වගකීම ඇතුලත්වේ. මූලික හදුනාගැනීමට පසුව සාධාරණ වටිනාකමට ලාභ අලාභ වල මූල්‍ය වගකීම සාධාරණ වටිනාකමට මනිනු ලබන අතර එහි වෙනස්කම් ලාභ හා අලාභ තුල හදුනාගනී.

මූලික හදුනාගැනීම මත, ගණුදෙනු පිරිවැය ලාභ හෝ අලාභ හට ගැනීමක් ලෙස හදුනාගනුයේ අත්පත්කර ගැනීමට අවශ්‍ය ඍජු ආරෝපන අගයක් ලෙසයි. මූල්‍ය වගකීම්වල නියමකරන ලද මානයක් සාධාරන වටිනාකමට ලාභ අලාභ වල මූලික අවස්ථාවේදී නියම කරන ලද මානයක් එම මූල්‍ය වත්කම්වල සාධාරන වටිනාකමින් ලාභ අලාභ වලට සමාන වේ.

**වෙනත් මූල්‍ය වගකීම**

සඵල පොළී අනුපාත ක්‍රමය භාවිතාකරමින් ක්‍රමක්ෂය පිරිවැයට පසුකාලින මැනීම් සහ ඍජු බෙදා වෙන්කළ හැකි අත්පත්කර ගැනීම්වල ගනුදෙනු පිරිවැය සාධාරණ අගයෙන් අඩුකර මූලිකව වෙනත් ණයට ගන්නා ලද අරමුදල් මනිනු ලබන අතර සමාගමේ මූල්‍ය වගකීම් තැන්පතු, ණය නිකුත් කිරීම් ඇතුලත් වේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනුයේ සඵල පොළී අනුපාතයේ සම්පූර්ණ කොටස වන ඕනෑම වට්ටම් හෝ ප්‍රතිලාභ මත නිකුත්කළ සහ පිරිවැය ගිණුම් තුලට ගැනීමෙනි.

### 4.13.2. මූල්‍ය වගකීම් හඳුනා නොගැනීම

මූල්‍ය වගකීම් හඳුනා නොගනුයේ බැඳියාවට යටත් වගකීම නිදහස් කිරීම හෝ අවලංගුවීම හෝ කල්පැනයාම සිදුවූ විටය. පවතින මූල්‍ය වගකීමක් පසුකාලිනව වෙනත් කොන්දේසි මත එකම ණයහිමියාගෙන් වෙනත් අයෙකුට පැවරීම, හෝ පවතින වගකීම කොන්දේසි පසුකාලිනව වෙනස් කිරීම, එවැනි මාරු කිරීම් හෝ වෙනස් කිරීම, නව වගකීමේ හඳුනාගැනීමක් හෝ නියම වගකීමේ හඳුනා නොහැගීමක් ලෙස කරනු ලබයි. නියම මූල්‍ය වගකීමේ ධාරන අගය හා ගෙවන ලද ප්‍රමාණය අතර වෙනස ආදායම් ප්‍රකාශය හඳුනාගනී.

**4.14. වෙන් කිරීම**

වෙන්කිරීම් හඳුනාගනුයේ සමාගමේ අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳියාව (නීතිමය හෝ ප්‍රයොජනවත්) ඇති විට සහ බැඳියාව නිරාකරණය කිරීමට අවශ්‍ය විය හැකි ආර්ථික ප්‍රතිලාභ පිළියෙල කරන සම්පතක ගලායාමක් සහ බැඳියාවේ වටිනාකමේ සිදුකරන ඇස්තමේන්තුවකින්ය. ඕනෑම වෙන් කිරීමකට අදාල වියදම් ප්‍රකාශනය තුළ ශුද්ධ ප්‍රතිපූර්ණයක් ලෙස ඉදිරිපත් කරයි.

**4.15. මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය මුදල් ප්‍රවාහ ප්‍රකාශය යන ප්‍රමිතයේ නියමයන් අනුකූලව වක්‍ර ක්‍රමය යොදාගනිමින් සකස් කර ඇත. මුදල් හා මුදල් සමාන දෑ වල අතැති මුදල්, බැංකු මුදල් සහ බැංකු අයිරා අඩංගු වේ.

**4.16. ජේදාත්මක තොරතුරු**

ජේදයක් යනු සේවා සැපයීම තුළ නියැලෙන හඳුනාගත හැකි අංගයන් වන අතර වෙනත් අංගයන්ගේ වෙනස්කම්වල අවධානම් සහ ප්‍රතිලාභවලට මූලික වේ. සමාගම හඳුනාතහැකි අංගයන් සියළු මෙහෙයුම් තුල එක් අංගයක් ලෙස නොසලකයි.

**4.17. නිකුත් කරන ලද නමුත් තාමත් ක්‍රියාත්මක නොවූ ප්‍රමිත**

මූල්‍ය ප්‍රකාශණ නිකුත්කර දිනට ක්‍රියාත්මක නොවූ නිකුත්කල ප්‍රමිත පහත දැක්වේ. සමාගම මෙම ප්‍රමිත ඒවා ක්‍රියාත්මක වූ විට යොදාගනු ලබයි. සවිස්තරාත්මක විමර්ශණයක් සිදුකරමින් පවතින අතර මෙම මූල්‍ය ප්‍රකාශණ ප්‍රසිද්ධ කරන දිනට සැලකිය යුතු තක්සේරුවක් මත සැලකිය යුතු මූල්‍ය බලපෑමක් නොමැත.

- SLFRS 09
  මූල්‍ය උපකරණ වර්ගීකරණය සහ මැනීම
- SLFRS 10
  ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශණ
- SLFRS 11
  බද්ධ සංස්ථාපනය
- SLFRS 12
  වෙනත් ඒකකතුළ පොළී හඳුනාගැනීම
- SLFRS 13
  සාධාරණ අගය මැනීම

# මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ සටහන්

| | | 2012/2013<br>රු. | 2011/2012<br>රු. |
|---|---|---|---|
| 5. | **ආදායම්** | | |
| | එප්පාවල රොක් පොස්පේට් | 327,697,521 | 393,480,918 |
| | අධි ශ්‍රේණියේ එප්පාවෙල රොක් පොස්පේට් | 71,333,960 | 97,798,615 |
| | | 399,031,481 | 491,279,533 |
| 6. | **වෙනත් ආදායම්** | | |
| | **ණය හා ලැබිය යුතු දෑ** | | |
| | පොලී ආදායම | 48,616,904 | 37,507,732 |
| | විකිණීම සඳහා ඇති | | |
| | ලාභාංශ ආදායම | 540,000 | 450,000 |
| | විවිධ ආදායම | 4,251,443 | 167,472 |
| | | 53,408,346 | 38,125,203 |
| 7. | **මූල්‍ය පිරිවැය** | | |
| | හර බද්ද | - | 8,933 |
| | | - | 8,933 |
| 8. | **මෙහෙයුම් වලින් ලාභය (පහත අයිතමයන් අයකිරීමෙන් පසු දක්වා ඇත)** | | |
| | කාර්ය මණ්ඩල පිරිවැය | 156,989,254 | 161,143,086 |
| | අධ්‍යක්ෂ ගාස්තු | 331,500 | 356,500 |
| | අධ්‍යක්ෂ වියදම් | 240,000 | 240,000 |
| | ක්ෂයවීම් | 7,841,011 | 8,165,100 |
| | විගණන ගාස්තු | 446,242 | 336,739 |
| | පාරිතෝෂිත ගෙවීම් | 6,194,069 | 8,507,722 |
| 9. | **ආදායම් බදු** | | |
| | වාර්ෂික ලාභය සඳහා ආදායම් බද්ද (සටහන - 9.1) | 33,746,610 | 55,466,919 |
| | විලම්බිත බදු | 4,965,601 | 3,188,443 |
| | | 38,712,211 | 58,655,362 |

## 9.1 ආදායම් බදු වියදම් සැසඳීම

| | | |
|---|---|---|
| බදු පෙර ලාභය | 135,624,133 | 188,460,539 |
| ව්‍යාපාරික නොවන ආදායම් | (64,274,339) | (32,666,359) |
| ඒඩ නොලද වියදම් එකතුව | 36,028,653 | 40,677,675 |
| ඒඩ ලද වියදම් එකතුව | (31,150,452) | (35,042,875) |
| පොලී ආදායම්/ස්ථාවර වත්කම් ඉවත්කිරීමේ ලාභය | 45,440,620 | 32,720,449 |
| **බදු අය කළ හැකි ලාභය** | 121,668,616 | 194,149,428 |
| | | |
| ආදායම් බද්ද 28% | 34,067,212 | 54,361,840 |
| නාමමාත්‍රික බදු බැර | (320,602) | (504,090) |
| පසුගිය වසරට වැඩියෙන් වෙන්කිරීම | - | 1,609,169 |
| | 33,746,610 | 55,466,919 |

## 10. කොටසක සාමාන්‍ය ඉපැයීම

කොටසක සාමාන්‍ය ඉපයුම් ගණනය කර ඇත්තේ සාමාන්‍ය කොටස් කරුවන්ට බෙදාහැරිය හැකි ලාභය, වර්ෂය තුළ බරතැබූ සාමාන්‍ය කොටස්වල එකතුවෙන් බෙදීමෙන්ය.

| | 2012/2013 | 2011/2012 |
|---|---|---|
| සාමාන්‍ය කොටස්කරුවන්ට බෙදා හැරිය හැකි ශුද්ධ ලාභය | 79,535,773 | 129,805,177 |
| වර්ෂය තුළ නිකුත්කර තිබූ බර තැබූ සාමාන්‍ය කොටස් ගණන | 7,251,000 | 7,251,000 |
| **කොටසකට සාමාන්‍ය ඉපැයීම (රුපියල්)** | 11 | 18 |

## සී/ස ලංකා පොස්පේට් සමාගම

# මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ සටහන්

| පිරිවැය | ගොඩනැගිලි රු | යන්ත්‍ර සූත්‍ර හා පිරියත රු | රථවාහන රු | කාර්යාල උපකරණ රු | විදුලි උපකරණ රු | ලී බඩු සහ උපකරණ රු | රසායනාගාර උපකරණ රු | පරිගණක දෘඩාංක සහ මෘදුකාංග රු | විවිධ වත්කම් රු | කෙරීගෙන යන වැඩ රු | එකතුව රු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශේෂය 01.04.2011 | 32,838,448 | 32,411,419 | 33,853,221 | 1,996,007 | 2,230,155 | 3,488,511 | 407,463 | 8,408,100 | 8,649,112 | 6,589,652 | 130,872,088 |
| එකතුවීම් | 1,869,745 | 13,000 | 18,800,000 | 44,800 | 1,278,214 | 476,968 | - | 2,907,999 | 513,180 | 36,282,403 | 62,186,309 |
| ශේෂය 31.03.2012 | 34,708,192 | 32,424,419 | 52,653,221 | 2,040,807 | 3,508,369 | 3,965,479 | 407,463 | 11,316,099 | 9,162,292 | 42,872,055 | 193,058,396 |
| එකතුවීම් | - | - | 3,260,000 | - | 34,500 | 165,729 | - | 299,800 | 1,003,363 | 2,744,578 | 7,507,970 |
| ශේෂය 31.03.2013 | 34,708,192 | 32,424,419 | 55,913,221 | 2,040,807 | 3,542,869 | 4,131,208 | 407,463 | 11,615,900 | 10,165,655 | 45,616,633 | 200,566,366 |
| **සමුච්චිත ක්ෂය** | | | | | | | | | | | |
| ශේෂය 01.04.2011 | 16,106,671 | 24,182,742 | 25,621,138 | 1,568,384 | 1,550,317 | 3,007,862 | 389,983 | 6,910,807 | 5,490,768 | - | 84,828,672 |
| වර්ෂය සඳහා අයකිරීම් | 1,313,537 | 1,798,485 | 3,240,417 | 118,122 | 151,972 | 204,603 | 4,370 | 745,153 | 588,439 | - | 8,165,099 |
| ශේෂය 31.03.2012 | 17,420,208 | 25,981,227 | 28,861,555 | 1,686,506 | 1,702,289 | 3,212,465 | 394,353 | 7,655,961 | 6,079,207 | - | 92,993,771 |
| වර්ෂය සඳහා අයකිරීම් | 1,388,328 | 1,373,480 | 2,800,833 | 118,966 | 237,433 | 238,541 | 4,370 | 1,020,001 | 659,060 | - | 7,841,011 |
| ශේෂය 31.03.2013 | 18,808,536 | 27,354,708 | 31,662,388 | 1,805,471 | 1,939,722 | 3,451,006 | 398,723 | 8,675,961 | 6,738,266 | - | 100,834,782 |
| ලියාහරින ලද අගය වර්ෂ අවසාන ශේෂය | 15,899,656 | 5,069,711 | 24,250,833 | 235,336 | 1,603,146 | 680,202 | 8,740 | 2,939,938 | 3,427,389 | 45,616,633 | 99,731,584 |
| **ලියාහරින ලද අගය ආරම්භක ශේෂය** | 17,287,984 | 6,443,192 | 23,791,666 | 354,301 | 1,806,079 | 753,014 | 13,110 | 3,660,139 | 3,083,085 | 42,872,055 | 100,064,625 |

## 12. කොටස් ආයෝජන පවත්වාගැනීම

| | % | 31.03.2013 | 31.03.2012 | 31.03.2011 |
|---|---|---|---|---|
| | | රුපියල් | රුපියල් | රුපියල් |
| GSMB ටෙක්නිකල් සර්විස් සමාගමේ ආයෝජන රුපියල් 10 බැගින් වූ කොටස් 100,000 | 17% | 1,000,000 | 1,000,000 | 1,000,000 |

GSMB ටෙක්නිකල් සර්විස් සමාගම ලැයිස්තුගත සමාගමක් නොවන බැවින් ආයෝජනවල සාධාරණ අගයක් ලබාගත නොහැක. එමනිසා කළමණාකරණය විසින් අදාල ආයොජනය එම සමාගමට ආවේනික වූ ව්‍යාපාර කටයුතුද සැලකිල්ලට ගෙන පිරිවැයට වාර්තා කරයි. තවද කළමණාකරනයට අදාල ආයෝජනය විකුණා ලාභ ලැබීමේ අදහසක්ද නොපවතී.

## 13. දිගුකාලීන ණය සී/ස බෝගල ග්‍රැෆයිට් ලංකා

| | 2012/2013 | 2011/2012 | 2010/2011 |
|---|---|---|---|
| | රුපියල් | රුපියල් | රුපියල් |
| ආරම්භක ශේෂය | 5,037,391 | 7,446,611 | 10,074,851 |
| වර්ෂයතුල වාරික ලැබීම | (2,847,260) | (2,409,220) | (2,628,240) |
| | 2,190,131 | 5,037,391 | 7,446,611 |
| කලින් ලැබූ වාරික | (887,113) | (887,113) | (887,113) |
| | 1,303,018 | 4,150,278 | 6,559,498 |
| වර්ෂයක් තුල ලැබිය යුතු වාරික | 1,303,018 | 2,628,240 | 2,628,240 |
| වර්ෂයකින් පසුව ලැබිය යුතු වාරික | - | 1,522,038 | 3,931,258 |
| | 1,303,018 | 4,150,278 | 6,559,498 |

## 14. විලම්භිත බදු

| | | | |
|---|---|---|---|
| වර්ෂයේ ආරම්භක ශේෂය | 7,353,957 | 10,542,400 | 7,124,790 |
| වර්ෂය තුල කපාහරින ලද | (4,965,601) | (3,188,443) | 3,417,610 |
| වර්ෂ අවසාන ශේෂය | 2,388,357 | 7,353,957 | 10,542,400 |

### 14.1 වර්ෂ අවසාන විලම්භිත බදු වගකීම පහත දේ වලින් සමන්විතවේ

| | | | |
|---|---|---|---|
| බදු ගණනය පිනිස සැලකූ ක්ෂයවීම්වල වැඩිවීම් | 18,509,758 | 17,052,740 | 14,230,657 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම | (27,039,602) | (43,316,874) | (51,882,087) |
| | (8,529,844) | (26,264,134) | (37,651,430) |
| විලම්භිත බදු වත්කම @ 28% | 2,388,356 | 7,353,958 | 10,542,400 |

## 15. තොග

| | | | |
|---|---|---|---|
| වෙළඳ තොගය | 22,064,775 | 16,151,045 | 5,576,908 |
| සාමාන්‍ය තොගය | 65,741,954 | 53,479,195 | 35,664,915 |
| | 87,806,730 | 69,630,240 | 41,241,824 |
| සාමාන්‍ය තොග සඳහා හානිකරණය | (587,838) | (587,838) | (587,838) |
| | 87,218,892 | 69,042,402 | 40,653,986 |

**16. තැන්පත්,කලින් ගෙවීම් හා වෙනත් ලැබිය යුතු දෑ**

| | | | |
|---|---|---|---|
| සේවක ණය සහ අත්තිකාරම් | 46,294,256 | 45,307,909 | 48,762,025 |
| කලින් ගෙවූ කාර්යාල වන්දි | 1,295,489 | 3,603,306 | 3,196,251 |
| තැන්පත් | 1,456,246 | 982,426 | 738,000 |
| කලින් ගෙවීම් | 1,156,612 | 4,572,058 | 2,626,632 |
| | 50,202,603 | 54,465,699 | 55,322,909 |

| | **31.03.2013** | **31.03.2012** | **31.03.2011** |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **17. මුදල් සහ මුදල් සමාන දෑ** | | | |
| REPO ලංකා බැංකුව | 29,531,405 | 26,010,357 | 44,666,015 |
| මුද්දර සංචිතය | 4,083 | 15,272 | 23,702 |
| බැංකුවේ මුදල් | 8,721,267 | 19,556,009 | 5,569,608 |
| අතැති මුදල් | 85,000 | 85,000 | 85,000 |
| | 38,341,754 | 45,666,638 | 50,344,325 |
| **18. ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | | |
| නිකුත් කළ සහ සම්පූර්ණයෙන් ගෙවූ කොටස් | 72,510,000 | 72,510,000 | 72,510,000 |
| සාමාන්‍ය කොටස් | 7,251,000 | 7,251,000 | 7,251,000 |
| **19. විශ්‍රාමික පාරිතෝෂික බැඳීම්** | | | |
| **වර්ෂය ආරම්භක ශේෂය** | 43,316,874 | 51,882,087 | 49,314,545 |
| **ප්‍රවර්ථන සේවා පිරිවැය** | 1,429,213 | 2,800,693 | 3,199,268 |
| පොලී වියදම | 4,764,856 | 5,707,030 | 4,684,882 |
| | 49,510,943 | 60,389,809 | 57,198,695 |
| වර්ෂය තුළ ගෙවීම් | (3,857,020) | (2,877,203) | (8,826,212) |
| ජීවගනක (ලාභ)/අලාභ | (18,614,321) | (14,195,733) | 3,509,604 |
| **වර්ෂය අවසාන ශේෂය** | 27,039,602 | 43,316,874 | 51,882,087 |

පාරිතෝෂික ගණනයේදී පහත උපකල්පනයන් පදනම් කොටගෙන ඇත.

| | | | |
|---|---|---|---|
| අපේක්ෂිත සාමාන්‍ය වාර්ෂික වේතන වැඩිවීම | 3% | 10% | 10% |
| වට්ටම් ප්‍රතිශතය | 11% | 11% | 9.5% |

## 20. අතිකුත් ගෙවිය යුතු හා උපචිත වියදම්

| | | | |
|---|---|---|---|
| රඳවා ගැනීමේ බදු | - | - | 201,133 |
| උපචිත වියදම් | 7,793,589 | 9,804,155 | 10,162,671 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 695,586 | 2,265,583 | 855,044 |
| | 8,489,175 | 12,069,738 | 11,218,848 |

## 21. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා සටහන්

21.1 වර්ෂය මුල මුදල් සහ මුදල් සමාන අයිතමයන්ගේ ශේෂය

| | | | |
|---|---|---|---|
| REPO ලංකා බැංකුව | 26,010,357 | 44,666,015 | - |
| මුද්දර සංචිතය | 15,272 | 23,702 | 24,062 |
| බැංකුවේ මුදල් | 19,556,009 | 5,569,608 | 21,220,643 |
| බැංකු අයිරාව | - | (6,108,668) | (1,840,004) |
| අතැති මුදල් | 85,000 | 85,000 | 85,000 |
| | 45,666,638 | 44,235,657 | 19,489,701 |

| | **31.03.2013** | **31.03.2012** | **31.03.2011** |
|---|---|---|---|
| **21.2** වර්ෂය අග මුදල් සහ මුදල් සමාන අයිතමයන්ගේ ශේෂය | **රු.** | **රු.** | **රු.** |
| REPO ලංකා බැංකුව | 29,531,405 | 26,010,357 | 44,666,015 |
| මුද්දර සංචිතය | 4,083 | 15,272 | 23,702 |
| බැංකුවේ මුදල් | 8,721,267 | 19,556,009 | 5,569,608 |
| බැංකු අයිරාව | - | - | (6,108,668) |
| අතැති මුදල් | 85,000 | 85,000 | 85,000 |
| | 38,341,754 | 45,666,638 | 44,235,657 |

## 22 මූල්‍ය උපකරණ වර්ගීකරණය කිරීම

| | | | |
|---|---|---|---|
| මූල්‍ය වත්කම් | | | |
| බැංකු මුදල් හා අත ඉතිරි මුදල් | 38,341,754 | 45,666,638 | 50,344,325 |
| **ණය හා ලැබිය යුතු දෑ** | | | |
| ණය ගැතියෝ | 39,256,431 | 33,175,325 | 31,198,225 |
| සේවක ණය සහ අත්තිකාරම් | 46,294,256 | 45,307,909 | 48,762,025 |
| තැන්පතු | 1,456,246 | 982,426 | 738,000 |
| කෙටි කාලීන තැන්පතු | 320,577,775 | 296,803,354 | 250,120,043 |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන | - | 956,168 | 887,208 |
| දිගු කාලීන ණය | | 1,522,038 | 3,931,258 |

**විකිණීම සඳහා පවතින**

| | | | |
|---|---|---|---|
| කොටස් ආයෝජන<br>මූල්‍ය වගකීම් | 1,000,000 | 1,000,000 | 1,000,000 |
| බැංකු අයිරාව | | | |
| **අනිකුත් මූල්‍ය වගකීම්** | | | |
| උපචිත වියදම් හා අනෙකුත් ගෙවියයුතු දෑ | 8,489,175 | 12,069,738 | 11,218,848 |
| ණය හිමියෝ | 9,349,444 | 2,702,576 | 3,928,609 |

## 23 මූල්‍ය අවදානම් කළමණාකරණය

සමාගමක කටයුතු විවිධාකාර වූ මූල්‍ය මූල්‍ය අවදානම් එනම් වෙළඳපොළ අවධානම් (මුදල් අවධානම පොළී අනුපාත අවධානම සහ මිල අවධානම් ඇතුළත්ව) ණය අවධානම, ද්‍රවශීල අවධානම් වලට මුහුණපා විවරව ඇත. සමාගමක සමස්ථ අවධානම් කළමණාකරන ක්‍රියාවලිය අවිනිශ්චිත මූල්‍ය අවධානම මත පදනම් වී ඇති අතර සමාගමෙහි මූල්‍ය ක්‍රියාකාරිත්වය මත ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල අවම කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ ප්‍රතිපත්තීන්ට අනුකූලව මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් අවධානම් කළමනාකරණය ක්‍රියාත්මක කරනු ලබයි.

සමාගමක මූලික මූල්‍ය උපකරණ තුල අන්තර්ගත වන්නේ කෙටිකාලීන තැන්පත් මූල්‍ය වෙළඳපොළ ආයෝජනයන් සහ මුදල්ය. මෙම මූල්‍ය උපකරණයන්හි ප්‍රධාන අරමුන වන්නේ සමාගමේ මෙහෙයුම් කටයුතු සඳහා ද්‍රවශීලතාව පවත්වා ගැනීමට සහ එය ඉහල දැමීමටත් සමාගමේ මූල්‍ය සංචිත වලට ලාභය උපරිම කිරීමත්ය. වෙළඳ ලැබිය යුතු දෑ සහ වෙළඳ ගෙවිය යුතු දෑ වැනි විවිධාකාර වූ අනිකුත් මූල්‍ය උපකරණයන් සමාගමක් සතුව ඇත. මේවා සමාගමෙහි ව්‍යාපාරික ක්‍රියාවන් තුළින් ඍජුව ජනිත වී ඇත.

**a) ණය අවධානම**

මූල්‍ය වත්කම්වල තත්ත්වය (ගුණය) හෝ හානිකරණයක් නොමැතිව තක්සේරු කළහැකි වනුයේ බාහිර ණය අනුපාත (තිබේ නම්) වලට හෝ ප්‍රතිවිරුද්ධ පැහැර හැරීමේ අනුපාත පිළිබඳ අතීත තොරතුරු වලට අනුකූලවය. ණය අවධානම හටගනු ලබනුයේ මුදල් හා මුදල් සමානදෑ සහ බැංකු හා මූල්‍ය ආයතනවල ඇති තැන්පතු මෙන්ම ගනුදෙනුකරුවන්ගෙන් ලැබීමට ඇති ණය හිඟ ලැබිය යුතු දෑ සහ ඒ හා බැඳුනු ගනුදෙනු ඇතුළත්වය.

**b) වෙළඳ ලැබිය යුතු දෑ**

වෙළඳ ලැබිය යුතු දෑ තුල අන්තර්ගත වී ඇත්තේ දේශීය ගනුදෙනුකරුවන්ය. ඉදිරියට කරගෙන යන ණය අගය කිරීම් (විනිශ්චය කිරීම්) ක්‍රියාත්මක කරනුයේ මූල්‍ය ගිණුම් ලැබිය යුතු දෑ කොන්දේසි මතය. එක් ප්‍රතිවිරුද්ධ පාර්ශවයක් හෝ ප්‍රතිවිරුද්ධ පාර්ශව කණ්ඩායමක් පිළිබඳව සැළකිය යුතු ණය අවධානමක් සමාගම සතුව ඇත. සමාගමක් ණය කොන්දේසි අනුමත කිරීමට ප්‍රථම පාරිභෝගිකයා විනිශ්චය කිරීමට ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පිහිටුවාගෙ ඇත.

**c) ද්‍රවශීල අවධානම**

මුදල් ප්‍රවාහ පුරෝකථනය කිරීම කරනු ලබන්නේ මූල්‍ය අංශය විසිනි. මෙහෙයුම් අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් මුදල් පවතීද යන්න තහවුරු කර ගැනීමට පුරෝකථනය කල සමාගමික ද්‍රවශීලතා නියමයන්ගේ හැසිරීම මූල්‍ය අංශය අධීක්ෂණය කරයි. අතිරික්ත මුදල් ඇති හා කාරක ප්‍රාග්ධන කළමණාකරනය සඳහා අවශ්‍ය ඉහත සඳහන් ශේෂය බැංකු තැන්පතුවල ආයෝජනය කර ඇත. වාර්තා දිනයේදී සමාගම සතුව තැන්පත් රුපියල් **320,577,775 (2012.03.31 රු. 296,803,354)** පැවතිය. එය ද්‍රවශීලතා අවධානම් කළමණාකරණය කිරීමෙහිලා පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කර ගැනීමට අපේක්ෂා කරන ලදී.

**d) පොළී අනුපාත අවධානම්**

සමාගම සතුව මුදල් හා රාජ්‍ය හා බැංකුවල කල තැන්පතු සහිත බැංකු ශේෂයන් ඇත. ප්‍රතිලාභ වක්‍ර හැසිරීම සහ පොළී අනුපාත චලනයන් ක්‍රියාකිරීම අධීක්ෂණය කිරීමෙන් සමාගමට පොළී අනුපාත අවධානම පාලනය කල හැක.

**e) ප්‍රාග්ධන අවදානම් කළමනාකරණය**

ප්‍රාග්ධන කළමනාකරණයෙහිලා සමාගමේ අරමුණ වනුයේ කොටස් හිමියන්ට සහ අනිකුත් පාර්ශවයන්ට ප්‍රතිලාභ ලබාදීම සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පවත්වාගැනීමේ හැකියාව සහතික කරගැනීම සහ උපරිම ප්‍රාග්ධන ව්‍යුහය පවත්වාගනිමින් ප්‍රාග්ධන පිරිවැය අවම කර ගැනීමත්ය.

## 24 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත ප්‍රථම වරට යොදාගැනීම

සටහන් අංක 2.1 සඳහන් පරිදි මෙම සමාගමේ / සමූහයේ මූල්‍ය වාර්තා සකස්කොට ඇත්තේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත වලට අනුකූලවය. සටහන් අංක 03හි සඳහන් කර ඇති ගිණුම් ප්‍රතිපත්ති 2013 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී යොදාගෙන ඇත. සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත්තේ 2012 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා වන අතර සහ ආරම්භක ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සකස්කොට ඇත්තේ 2011 අප්‍රේල් 01 දිනට (පරිවර්තක දිනය) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය පදනම්ය. සැසඳුම් ප්‍රකාශණය පහත දැක්වේ.

### 4.1 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත යොදාගැනීම නිසා 2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායමට වූ බලපෑම

| | | SLAS රුපියල් | ගැලපීම් රුපියල් | SLFRS රුපියල් |
|---|---|---|---|---|
| ආදායම | | 491,279,533 | - | 491,279,533 |
| විකුණුම් පිරිවැය | | (192,287,312) | - | (192,287,312) |
| දළ ලාභය | | 298,992,221 | - | 298,992,221 |
| වෙනත් ආදායම් | (b) | 49,908,731 | (11,783,528) | 38,125,203 |
| බෙදාහැරීමේ වියදම් | | (7,114,844) | - | (7,114,844) |
| පරිපාලන වියදම | (a) & (b) | (140,359,076) | (1,174,033) | (141,533,109) |
| මූල්‍ය පිරිවැය | | (8,933) | - | (8,933) |
| බදු පෙර ලාභය | | 201,418,100 | (12,957,561) | 188,460,539 |
| බදු වියදම | | (58,655,362) | - | (58,655,362) |
| **වර්ෂය සඳහා ලාභය** | | 142,762,738 | | 129,805,177 |
| **වෙනත් විස්තීර්ණ ආදායම** | | | | - |
| නියමිත ප්‍රතිලාභ සැලසුම්මත ආයුකරණ ලාභය (අලාභය) | (d) | | 14,195,733 | 14,195,733 |
| **වෙනත් විස්තීර්ණ ආදායම් වල එකතුව** | | | | 14,195,733 |
| **මුළු විස්තීර්ණ ආදායම** | | | | 144,000,910 |

### 24.2 මුළු විස්තීර්ණ ආදායමට සැසඳුම

| | 2011/2012 Rs |
|---|---|
| SLAS වලට අනුව බදු පසු ලාභය | **142,762,738** |
| *(a)* කීර්තිනාමය කපාහැරීම නැවත සැකසීම | 1,238,172 |
| *(b)* සේවක ණය වෙළඳපල පොලියට ගැලපීම මත වූ අතිරේඛ පොලී ආදායම සැලකිල්ලට ගැනීම | 1,235,570 |
| *(b)* පෙර ගෙවීම් කරන ලද සේවක පිරිවැය කපාහැරීම | (1,235,570) |
| SLFRS වලට අනුව බදු පසු ලාභය | **144,000,910** |

## 24.3 SLFRS වලට අනුගතවීම නිසා ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ඇතිවන බලපෑම

| | | 2011 අප්‍රේල් 01 දිනට ආරම්භක ශේෂය | | | 2012 මාර්තු 31 (අවසන් දිනට ශේෂය) | | |
|---|---|---|---|---|---|---|---|
| | | SLAS | ගැලපීම් | SLFRS | SLAS | ගැලපීම් | SLFRS |
| | | රුපියල් | රුපියල් | රුපියල් | රුපියල් | රුපියල් | රුපියල් |
| **වත්කම්** | | | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | | | |
| දේපල පිරියත හා උපකරණ | | 46,043,415 | - | 46,043,415 | 100,064,625 | - | 100,064,625 |
| ප්‍රාග්ධන ආයෝජන | | 1,000,000 | - | 1,000,000 | 1,000,000 | - | 1,000,000 |
| භාණ්ඩාගාර බැදුම්කර ආයෝජන | | 887,208 | - | 887,208 | 956,168 | - | 956,168 |
| දිගුකාලීන ණය | | 3,931,258 | - | 3,931,258 | 1,522,038 | - | 1,522,038 |
| කීර්තිනාමය | *(a)* | 6,192,052 | (6,192,052) | - | 4,953,880 | (4,953,880) | - |
| විලම්භිත බදු | | 10,542,400 | - | 10,542,400 | 7,353,957 | - | 7,353,957 |
| | | 68,596,333 | | 62,404,281 | 115,850,668 | | 110,896,788 |
| **ජංගම වත්කම්** | | | | | | | |
| තොගය | | 40,653,986 | - | 40,653,986 | 69,042,402 | - | 69,042,402 |
| වෙළඳ ලැබිය යුතු | | 31,198,225 | - | 31,198,225 | 33,175,325 | - | 33,175,325 |
| තන්පතු කලින් ගෙවීම් හා වෙනත් ලැබියයුතු | *(c )* | 65,318,941 | (9,996,032) | 55,322,909 | 66,279,410 | (11,813,711) | 54,465,699 |
| දිගුකාලීන ලැබියයුතු ණය – වර්ෂයක් ඇතුලත් | | 2,628,240 | - | 2,628,240 | 2,628,240 | - | 2,628,240 |
| කෙටිකාලීන තැන්පතු | *(c )* | 240,190,027 | 9,930,017 | 250,120,043 | 285,000,000 | 11,803,354 | 296,803,354 |
| අතැති මුදල් සහ බැංකු මුදල් | *(c )* | 50,278,310 | 66,015 | 50,344,325 | 45,656,281 | 10,357 | 45,666,638 |
| | | 430,267,728 | | 430,267,728 | 501,781,659 | | 501,781,659 |
| **මුළු වත්කම්** | | **498,864,061** | | **492,672,009** | **617,632,327** | | **612,678,447** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **හිමිකම් සහ වගකීම්** | | | | | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | | | | | |
| ප්‍රකාශකල ප්‍රාග්ධනය | | 72,510,000 | - | 72,510,000 | 72,510,000 | - | 72,510,000 |
| රඳවාගත් ලාභ | *(a)* | 339,432,104 | (6,192,052) | 333,240,052 | 462,194,841 | (4,953,880) | 457,240,961 |
| **මුළු හිමිකම්** | | **411,942,104** | | **405,750,052** | **534,704,841** | | **529,750,961** |
| **ජංගම නොවන වගකීම** | | | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ | | 51,882,087 | - | 51,882,087 | 43,316,874 | - | 43,316,874 |
| **ජංගම වගකීම්** | | | | | | | |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | 3,928,609 | - | 3,928,609 | 2,702,576 | - | 2,702,576 |
| දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් | | 13,783,746 | - | 13,783,746 | 24,838,298 | - | 24,838,298 |
| වෙනත් ගෙවිය යුතු | | 11,218,848 | - | 11,218,848 | 12,069,738 | - | 12,069,738 |
| බැංකු අයිරා | | 6,108,668 | - | 6,108,668 | - | - | - |
| | | 35,039,870 | | 35,039,870 | 39,610,611 | | 39,610,611 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **498,864,061** | | **492,672,009** | **617,632,327** | | **612,678,447** |
| | | **(0)** | | **0** | **(0)** | | **(0)** |

**24. 4 හිමිකම සැසඳීම**

| | 2012.03.31 | 2011.04.01 |
|---|---|---|
| **SLAS වලට අනුව මුළු හිමිකම්** | **534,704.841** | **411,942.104** |
| a) කීර්තිනාම කපාහැරීම | (6,192.052) | (6,192.052) |
| a) කීර්තිනාම ක්‍රමක්ෂය ප්‍රතිවර්ථනය | 1,238.172 | - |
| b) වෙළඳපල අනුපාතයට සේවක ණය වල අමතර පොලී ආදායම හඳුනාගැනීම | 1,235,570 | - |
| b) කලින්ගෙවූ සේවක ණය ක්‍රමක්ෂය | (1,235,570) | - |
| **SLFRS වලට අනුව මුළු හිමිකම්** | **529,750,961** | **405,750,052** |

a) 1997 වර්ෂයේදී රාජ්‍ය පතල් හා ඛණිජ සංවර්ධන සංස්ථාවේ පොස්පේට් ක්‍රියාකාරකම්, ලංකා පොස්පේට් ලිමිටඩ් බවට පරිවර්තනය කරන ලදී. නිකුත්කල ප්‍රකාශිත ප්‍රාග්ධනය හා ශුද්ධ වත්කම් වල වෙනස තුලින් ඇතිවූ අතිරික්තය කිර්තිනාමය ලෙස සලකන ලදී. හඳුනාගන්නා කිර්තිනාමය 1997.03.31න් අවසන් වර්ෂයේ සිට හඳුනාගන්නා ලද වර්ෂ 20ක් තුළ සරල මාර්ග ක්‍රමයට ක්‍රමක්ෂය කරන ලදී.

b) සමාගම විසින් වර්ෂයකට 7.2 % වන වෙළඳපල අනුපාතයට වඩා අඩු අනුපාතයට විවිධ ණය අනුපාත යටතේ සේවකයන්ට ණය ලබාදෙන ලදී. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත යොදාගැනීමත් සමග සමාගම විසින් නොගෙවූ ණය ශේෂයන් 13 % ක් වූ වට්ටම්කළ වර්තමාන වෙළඳපල අනුපාතයට හඳුනාගන්නා ලදී. ධාරණ අගය සහ වෙළඳ අනුපාතයට වර්තමාන අගය අතර වෙනස කලින් ගෙවූ සේවක වන්දි ලෙස හඳුනාගන්නා ලදී. එම කලින් ගෙවූ සේවක වන්දි, ණය කාලසීමාව පුරාවට අදායම් ප්‍රකාශයතුල ක්‍රමක්ෂය කිරීම සහ වියදමක් ලෙස හඳුනාගන්නා ලදී.

c) පෙර ගිණුම්කරණ භාවිතය යටතේ සමාගම විසින් ලැබිය යුතු පොලී, තැන්පතු කලින් ගෙවීම් සහ වෙනත් ලැබිය යුතු දෑ යටතේ හඳුනාගන්නා ලදී. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත යොදාගැනීමත් සමග සමාගම විසින් ලැබිය යුතු පොලී නැවත වර්ගීකරණය කරන ලද අතර ආයෝජනයේ සාධාරණ වටිනාකම හඳුනාගැනීමට ආයෝජනයේ කොටසක් ලෙස හඳුනාගන්නා ලදී.

d) පෙර ගිණුම්කරණ භාවිතය අනුව සමාගම විසින් ආයුගණක උපකල්පන වෙනස්වීම මත ලාභ හා අලාභ පරිපාලන වියදම් යටතේ හඳුනාගන්නා ලදී. LKAS 19 – සේවක ප්‍රතිලාභ ප්‍රමිතයේ අවශ්‍යතා අනුව, සමාගම විසින් එම ලාභ හා අලාභ වෙනත් විස්තිරණ ආදායම් යටතේ හඳුනාගන්නා ලදී.

**24.5** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශණය සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත වලට පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශණය සහ අතර ප්‍රමාණාත්මක වෙනස්කම් නොමැත.

**25. අසම්භව්‍ය වත්කම් වගකීම්**

පනතේ දැක්වෙන නීතිමය බලපෑම හැරෙන්නට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට ප්‍රමානාත්මක අසම්භව්‍ය වත්කම් වගකීම් සමාගමට මතුව නැත.

i) නඩු අංක, LPL/COU/03-1 සහ LPL/COU/03-02 දරන අංක යටතේ තුන්වන පාර්ශවයක් විසින් රු. මිලියන 2.5 අලාභයක් ඉල්ලා අනතුරක් සම්බන්ධව නඩු පවරා ඇත.

ii) අවසාන ප්‍රතිඵලය ගැන කිව නොහැකි සේවක නඩු දෙකක් පවතී.

**26.** **බැදීම්**

**මූල්‍ය බැදීම්**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශ දිනට ප්‍රමාණාත්මක මූල්‍ය බැදීම් නැත.

**ප්‍රාග්ධන මූල්‍ය බැදීම්**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශ දිනට ප්‍රාග්ධන වියදම් පවතී. නමුත් මූල්‍ය ප්‍රකාශවල හඳුනාගෙන නැත. ඒවා පහත පරිදිවේ.

| | 2013.03.31 | 2012.03.31 |
|---|---|---|
| | රු | රු |
| ඉදිවෙමින් පවතින නව කර්මාන්ත නිෂ්පාදනයකට නොගෙවූ ප්‍රාග්ධන වියදම | 9,924,513 | 18,201,526 |

**27.** **වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු සිදුවීම්**

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ අනාවරණය කිරීම අවශ්‍ය මූල්‍ය ප්‍රකාශන දිනයේ සිට පැන නගින කරුණු අවස්ථා නැත.

**28.** **සම්බන්ධිත පාර්ශව ගණුදෙනු**

**ප්‍රධාන කළමණාකරණ නිළධාරීන් සමග සිදුවෙන ගනුදෙනු**

සම්බන්ධිත පාර්ශවයට වර්ෂයේ ප්‍රධාන කළමණාකරණ නිලධාරීන් ඇතුලත්වේ. හඳුන්වන ලද මෙම නිලධාරීන්ට ව්‍යාපාරය සැලසුම්කිරීම අධ්‍යක්ෂණය හා පාලනය යන ක්‍රියාකාරකම් සඳහා අධිකාරිය හා වගකිම් පවතී. ප්‍රධාන කළමණාකරණ නිළධාරියාට ව්‍යාපාරයේ අධ්‍යක්ෂකවරු ඇතුලත්වේ. වර්ෂයේ ප්‍රධාන නිළධාරීන් කළමණාකරණ නිළධාරීන් පාර්ශව වේ.

| | 2012/2013 | 2011/2012 |
|---|---|---|
| | රු | රු |
| කෙටිකාලින ප්‍රතිලාභ | 3,227,665.24 | 3,372,004 |

**28.2** **වෙනත් සම්බන්ධිත පාර්ශව ලෙස හඳුනාගත් ගණුදෙනු**


වෙනත් සම්බන්ධිත පාර්ශව ලෙස හඳුනාගත් ගණුදෙනු ක්‍රියාකාරකම් කිසිවක් නැත.

# මෙහෙයුම් ක්‍රියාවලි සමාලෝචනය

**2012/2013** වසර සඳහා මෙහෙයුම් සහ මෙහෙයුම් ප්‍රතිඵල මෙන්ම ආයතනයේ අනාගත සැලසුම් පිළිබඳ සංශිප්ත විශ්ලේශණයක් පහතින් දැක්වේ.


## 01. <u>ලාභදායිත්වය</u>

**2012/2013** වර්ෂය සඳහා බදු ගෙවීමට පෙර ලාභය රුපියල් මිලියන **118.25** කි. කෙසේ හෝ වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම (බදු පෙර) රු. මිලියන **136.86**කි. පසුගිය වර්ෂයට සාපෙක්ෂව ආසන්න වශයෙන් එය **32%**ක පහළ බැසීමකි. වසර පුරා පැවති අනපේක්ෂිත කාලගුණය හා වසර අගභාගයේ පැවති පොහොරවල හිගය මෙම පසු බැසීම සඳහා බලපානු ලැබිය.





## 02. <u>ශුද්ධ වත්කම්</u>

ආයතනය අඛණ්ඩ යහපත් ශුද්ධ වත්කම් ප්‍රමාණයක් පවත්වාගෙන යාමට සමත්ව ඇත. පසුගිය වසර අගවන විට පැවති රු. මිලියන **535** ක් වූ ශුද්ධ වත්කම් ප්‍රමාණය මෙම වසර අගවන විට රු. මිලියන **588** දක්වා වර්ධනය වී ඇත.



## 03. ආදායම

සමාගම විසින් වසර සඳහා රුපියල් මිලියන **399.0**ක දළ පිරිවැටුමක් වාර්තාකොට ඇති අතර එහිදි ERP මෙට්‍රික් ටොන් **39,216.25** ක් සහ HERP මෙට්‍රික් ටොන් **6,543.85** ක් විකුණුම් කොට ඇත. එය පසුගිය වර්ෂයට වඩා **19%** ක පහත බැසීමකි.




## 04. ප්‍රාග්ධන වියදම්

පසුගිය වසර සඳහා ප්‍රාග්ධන වියදම් පහත පරිදි වේ.

**අත්පත් කර ගැනීම් සහ කරගෙන යන ප්‍රාග්ධන වැඩ**


| | රුපියල් |
|---|---:|
| **2008/09** | **1,078,048/-** |
| **2009/10** | **1,720,805/-** |
| **2010/11** | **11,446,539/-** |
| **2011/12** | **62,186,309/-** |
| **2012/13** | **12,855,655/-** |

සමාගම ඊලග වසර තුලදී එහි නිෂ්පාදන වර්ධනය කරගැනීම ගබඩා පහසුකම් හා යටිතල පහසුකම් වර්ධනය කර ගැනීමට සැලසුම්කරයි.

## 05. මහා භාණ්ඩාගාරයට සහ රාජ්‍ය ආයතන වලට ගෙවීම් කිරීම

සමාගමේ එකම කොටස්කරුවා මහා භාණ්ඩාගාරය වේ. එමනිසා ගෙවනු ලබන ලාභාංශ සියල්ලම මහා භාණ්ඩාගාරයට යවනු ලබයි. මේ වසර සඳහා ගෙවනු ලබන ලාභාංශය රු. මිලියන **25**කි. මෙම ලාභාංශ ගෙවීමට අමතරව, ආදායම් බදු බණිජ බදු හා පුරස්කාරයක්ද සමාගමේ නිෂ්පාදන / විකුණුම් මත ගෙවනු ලබයි.

පසුගිය වසර **05**ක් සඳහා අදාල ගෙවීම්වල සාරාංශයක් පහත පරිදි වේ.




FINANCIAL SERVICES & COMMERCIAL AGENCIES (PRIVATE) LIMITED

## රැස්වීම් පිළිබඳ දැනුම්දීම

සී/ස ලංකා පොස්පේට් සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම **2013** සැප්තැම්බර් මස **30** වන දින පස්වරු 4. **30** ට කොළඹ 14, නව කැළණිපාලම පාර, අංක **73** 1/1 දරණ ස්ථානයේ පිහිටි ප්‍රධාන කාර්යාලයේදී පහත කාරණා සඳහා පවත්වන බව කොටස්කරුවන්ට මෙයින් දැනුම් දෙමි.

1 **2012** සැප්තැම්බර් මස **30** දිනැති වාර්ෂික මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තා අනුමත කිරීම

2 **2013** මාර්තු **31** දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශණ සහ විගණන වාර්තා භාර ගැනීමට සලකා බැලීමට සහ සම්මත කිරීම

3 මේ සමඟ එවනු ලබන වාර්ෂික වාර්තාව ලැබීමට සහ අනුමත කිරීම.

4 මහා භාණ්ඩාගාරයට සමාගමේ එකම කොටස්කරු ලෙස අවසාන ලාභාංශයක් **2012/2013** වර්ෂය සඳහා බෙදා හැරීම අනුමත කිරීම.

5 සමාගම් ව්‍යවස්ථාවලියේ අංක **93** අනුව ඉවත්ව යන අද්මිරාල් දායා සඳගිරි සහ පී. ඩී. ජේ. ජයවර්ධන යන අධ්‍යක්ෂකවරු නැවත පත් කිරීම.

6 **2013 / 2014** යන වසර සඳහා ඉවත්වන යන විගණකයින් වන එස්. ජේ. එම්. එස්. ඇසෝසියේට් නැවත පත්කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයට විගණකයින්ගේ ගාස්තු තීරණය කිරීමට බලය පැවරීම.

7 නියමිත දැනුම් දී ඇති ඕනෑම වෙනත් ව්‍යාපාර කටයුත්තක්. යෝජනාවක්, විනිශ්චයක් සලකා බැලීම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය මත




**සී/ස ෆයිනැන්ෂල් සර්විසස් සහ කොමර්ෂල් ඒජන්සීස් (පුද්ගලික) සමාගම**
**සී/ස ලංකා පොස්පේට් සමාගමේ ලේකම්වරු**

**සටහන්**

- මහා සභා රැස්වීමේදී කොටස් කරුවෙකුට ඡන්දය දීමට, ඔහු/ඇය වෙනුවෙන් ඡන්දය පාවිච්චි කිරීමට සහ පැමිණීමට ප්‍රතියුක්තකයෙකු පත් කිරීමට හිමිකම තිබේ.
- ප්‍රතියුක්තකයා සමාගමේ සාමාජිකයෙකු වීම අවශ්‍ය නැත.
- මෙම අරමුණ සඳහා ආකෘති පත්‍රය අමුණා ඇත.

## පෙරකලාසියේ ආකෘතිය

### *සී/ස ලංකා පොස්පේට් සමාගම*

### *බලපත්‍රය*

.....................................................................................පදිංචි........................................................ ................වන, මම/අපිඉහත සඳහන් සමාගමේ සාමාජිකයෙකු වීම හේතුවෙන් ............................................. .පදිංචි ....................................හෝ ඔහු/ඇය අසමත් වුවහොත් ........................................... පදිංචි ..........................................................යන අය මගේ/අපගේ බලය ලත් නියෝජිතයා වශයෙන් 2013 සැප්තැම්බර් මස 30 වන දින සමාගමේ පැවැත්වෙන වාර්ෂික මහා සභා රැස්වීමේදී සහ යම් කල් තැබීමකදිද එයට ප්‍රතිඵලයක් වශයෙන් පැවැත්වෙන සෑම ඡන්ද රැස්වීමකදීම, අප/මා වෙනුවෙන් ඡන්දය දීමට මෙයින් පත් කරමි/කරමු.

දෙදහස් දොළහ ..........................මස.........................දිනයේදී අත්සන් කරන ලදී.

.........................................

අත්සන

<u>සටහන</u>

නියෝජිතයාට ඔහුට සුදුසු යයි සිතෙන පරිදි රැස්වීමකදී ඉදිරියට

ගෙනෙන ලද ඕනෑම යෝජනාවකට ඡන්දය ප්‍රකාශ කිරීමට හැකිය.

නියෝජිතයා සමාගමේ සාමාජිකයෙකුවීම අවශ්‍ය නැත.

සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙස් මෙහි පිටුපස සටහන් කොට ඇත.